# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk
ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ උඳුවප් පුර අටවක පෝදා 2022 නොවැම්බර් 30 බදාදා BUDUSARANA WEDNESDAY NOVEMBER 30, 2022
ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 24 පත්‍රය , පිටු 10 ආරම්භය 1965 - 06 - 13



මත්ස්‍ය ජාතක කතාව ඇසුරිනි



# යහපත් ආකල්ප අනුන් නිසා අත්නොහරින්න

**තමන් ආරක්ෂා කර ගන්නා, ඇත්ත වශයෙන් තමා ම ය. කවර නම් ගැලවුම්කරුවකු එහි සිටිය හැකි ද? බාහිර ගැලවුම්කරුවකු සොයා ගැනීමේ ගැටලුව සඳහා ඇත්තේ තමා හොඳින් පාලනය වී සිටීමයි.**

බුදුරදුන් පිරිනිවන් පෑමට ආසන්නවත්ම උන්වහන්සේ වෙත තමන් වහන්සේගේ ශ්‍රාවකයෝ සියලුම දෙසින් පැමිණ ළං වූහ.

සෙසු ශ්‍රාවකයෝ නිරතුරුව උන්වහන්සේ වෙත රැළී සිටිමින් තම ශාස්තෘවරයා ගේ අපේක්ෂිත වියෝවීම ගැන සිතමින් මහත් දොම්නසින් සිටියහ.

අත්තදත්ත නම් වූ එක්තරා භික්ෂු නමක් තම කුටියට වැදී භාවනානුයෝගී වූහ. සෙසු භික්ෂූන් වහන්සේ එම භික්ෂු නම බුදුරජාණන් වහන්සේගේ තත්වය නොතකන්නෙකැයි සිතමින් විමතියට පත් වූ හ.

ඒ පුවත බුදුරදුනට දන්වා සිටියහ. ඒ භික්ෂූන් වහන්සේ ද ඒ අනුව බුදුරදුන් අමතා මෙසේ පැවසූහ.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ තව සුළු කාලයකින් පිරිනිවන් පානා සේක.

උන්වහන්සේට ගෞරව කිරීමේ හොඳම මාර්ගය නම් බුදුරදුන් ජීවමානව සිටියදී රහත් බවට පත් වෙමි'යි මම භාවනා කෙළෙමි. බුදුරජාණන් වහන්සේ ඒ භික්ෂූන් වහන්සේගේ ආකල්පය හා හැසිරීම ගැන පැහැදුණු අතර අනුන් නිසා තමාගේ ආධ්‍යාත්මික ශුභ සාධනය අත් නො හැරිය යුතු බැව් වදාළ සේක.

මේ කථා පුවතින් බුදු සමයේ එක්තරා වැදගත් අංශයක් නිරූපණය වෙයි.

එනම් සෑම පුද්ගලයකු ම නිරන්තරයෙන් ම තමාගේ සංසාර විමුක්තිය සඳහා සූදානමින් සිටිය යුතු අතර ඔහුගේ ගැලවීම ලබා ගත යුත්තේ ඒ පුද්ගලයා විසින් ම බවයි. නිවන සාක්ෂාත් කර ගැනීමට බාහිර බලවේගයක හෝ නියෝජිතයකු ගේ සහාය පතා සිටිය නො හැකි බව ය. බුදු සමය තේරුම් නො ගත් ජනයා මේ සංකල්පය විවේචනය කරති. බුදු සමය ආත්මලාභී ආගමක් බවත්, එය නිතර ම කතා කරන්නේ දුකෙන් හා වේදනාවෙන් පුද්ගලයකු නිදහස් කර ගැනීමට අදහස් කිරීම පිළිබඳව බවත් බුදු සමය යථාර්ථවාදි ලෙස අවබෝධ කර නො ගත් අය කියනු ලබන්නකි. එහෙත් එය සම්පූර්ණ සත්‍යයක් නො වේ.

බුදුරදුන් දේශනා කර ඇත්තේ සෑම අයකු ම සෑම දෙනා ගේ ම ආධ්‍යාත්මික හා ලෞකික ශුභ සිද්ධිය සඳහා නො නවත්වා ක්‍රියා කළ යුතු බව ය. ඒ සමඟ ම සාක්ෂාත් කර ගැනීමේ නිෂ්ටාව කරා යෑමට හැම කෙනෙකු ම වීර්යවත් විය යුතු ය. මමත්වයෙන් තොර සේවාව බුදුරජාණන් වහන්සේ අගය කළ සේක.

හොඳ මනසකින් යුත් වාසනාවත් පුද්ගලයන්ට තම ප්‍රයත්නය මගින් ම නිවන ලැබීම කළ හැකි වුවත් එසේ මානසික හෝ ශාරීරික හෝ ලෞකික වශයෙන් පසුබට බැවින් යුත් අය කෙසේ නිවන් සාදා ගනිත් ද?

ඔවුහු කෙසේ ස්වයං විශ්වාසයක් ඇතිකර ගනිත් ද? ඔවුන්ට බාහිර බලවේගයක දෙවියකු ගේ ආධාරය අවශ්‍ය නොවන්නේ ද? යනු ප්‍රශ්නයකි.

එයට දිය හැකි පිළිතුර නම් බෞද්ධයන් අවසාන විමුක්තිය එක් ජීවිත කාලයක් තුළදී සිදු විය යුතු යැයි නො සිතන බව ය. සම්බෝධිය අපේක්ෂා කරන පුද්ගලයා විසින් තම ශක්ති ප්‍රමාණයෙන් ස්වයං විශ්වාසය ක්‍රම ක්‍රමයෙන් සංවර්ධනය කර ගත යුතු ය. ඒ නිසා පසුබටවන පුද්ගලයා ද මානසිකව ආධ්‍යාත්මිකව හා භෞතිකව ක්‍රම ක්‍රමයෙන් තම ප්‍රයත්නය ක්‍රියාත්මක කළ යුතු ය. ඉතා සුළු වශයෙන් වුවත් විමුක්තිය මාර්ගයේ ගමන් කිරීමට පටන් ගත යුතු ය. රෝද කැරකීමට සැලැස් වූ කල්හි ඒ තැනැත්තා හෙමින් හෙමින් තෙමේ ම තම ස්වයං විශ්වාසය දියුණු කර ගනු ඇත. කුඩා බීජය යම් දිනෙක වැඩී මහත් දැවැන්ත ගසක් බවට පත්වෙන්නාක් මෙනි. එය සතියක දී දෙහෙක දි සිදු නොවේ.

ඉවසීම මේ භාරදූර ක්‍රියාවලියේ වැදගත් අංගයකි. නිදසුනක් ගනිමු. මවුපියෝ තම දරුවන් තමන්ගේ බලාපොරොත්තු හා ප්‍රාර්ථනාවනට සරිලන සේ හදා වඩා ගැනීමට තමන්ගේ මුළු ශක්තිය යොදා කළ යුතු සියල්ල කරති. එහෙත් එම දරුවන් වැඩෙත් ම ඔවුනට රිසි පරිදි මුත් මව්පියන් අපේක්ෂිත පරිදි සංවර්ධනය නොවන බැව් පෙනේ. බුදු සමයට අනුව අපි විශ්වාස කරන්නේ ද යම් කිසිවකු ගේ ජීවිතය කෙරෙහි අන් අයට බලපෑම් කළ හැකි වුව ද ඒ පුද්ගලයා ගේ අභිමතය අවසානයේ දී ඔහු විසින් ඔහුගේ ම කර්මය උපදවන බවත් ඔහුගේ ක්‍රියාවන් සඳහා ඔහු ම වගකිව යුතු බවත් ය.

අවසාන විමුක්තිය ලබා ගැනීමට මෙහෙයවීම හෝ පාලනය කිරීම කිසිදු දේවතාවකුට හෝ මිනිසකුට බැරි බව අවසන් විග්‍රහයේ දී අපට දක්නට ලැබිණි. ස්වයං විශ්වාසය යන්නෙහි තේරුම එය වේ. යමකුට ආත්මලාභි වීමට බුදු සමය උගන්වති'යි මෙයින් අදහස් නො කෙරෙයි.

බුදු සමයට අනුව යම් කිසි කෙනෙක් තම ප්‍රයත්නයෙන් නිවන සාක්ෂාත් කෙරේ ද? හෙතෙම අධිෂ්ඨාන කරගෙන ඇත්තේ ප්‍රාණඝාතය, සොරකම, කාම මිත්‍යාචාරය, මුසාවාදය මත් පැනින් හා ඉන්ද්‍රිය අසංවරතාවෙන් වැළකීමට ය.

මෙසේ තමා විසින්ම පාලනය කරනු ලබද්දී ඔහු නිරායාසයෙන් අනුන්ගේ සුව පහසුවට කිසියම් පරිත්‍යාගයක් කෙරෙයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කරන විට දී සඳහන් කළ ස්වයං ආරක්ෂණ හැකියාවෙන් අදහස් කළේ මනස උසස් තත්වයෙන් සංවර්ධනය කරගත හැකි ජීව ආකෘතීන් ගැනයි. ඊට පෙර අවධිවල දී පරිනාමන කර්මයන් හා මානසික බලවේගයන් අක්‍රිය තත්වයෙන් තිබු නමුත් අනන්ත සංඛ්‍යාත ඉපදීම හේතු කොට සත්වයා නිදහස්ව සිතීමට හා තර්ක කිරීමට සමත් ජන්ම හැසිරීම් ඉක්මවා ගිය තත්වයකට නඟියි.

එම අවධියේ දී ය සත්වයාට පුනරුත්පත්තියේ අප්‍රමාණ වූ අර්ථ විරහිත වු ඉපදීම් හා ඒහා බැඳුන වේදනා හා දුක පිළිබඳ දැනුමක් ලැබෙනුයේ. ඒ අවස්ථාවේ දී සත්වයා පුනරුත්පත්තිය අවසන් කර සත්‍යාවබෝධය හා නිර්වාණ සුවය සොයා යාමට අවශ්‍ය අධිෂ්ඨානය ලබා ගෙන එකී උසස් බුද්ධිමත් භාවයෙන් පුද්ගලයා ඇත්ත වශයෙන් ම ස්වයං දියුණුව හා ස්වයං සංවර්ධනය සඳහා උද්‍යෝගිමත් වෙයි. එවිට මිනිසා බුද්ධියෙන් හා තර්ක කිරීමේ හැකියාව ඇතිව උපත ලබයි.

සමහරු වාසනාවන්තව උපදිති. එම විහිදීමේ අනිත් කෙළවර අවම බුද්ධියෙන් උපත ලබන අය ද වෙති. එහෙත් සෑම ජීවියකුට ම ජීවත්වීමේ අංශයෙන් බැලුවොත් කිසියම් දෙයක් තෝරා ගන්නා ආකාරය පිළිබඳ හැකියාවක් ඇත. ජීවිතය නිදහස් කර ගැනීමේ හෙවත් ජීවත්ව සිටීමේ සාධකය තිරිසන් ලෝකය තෙක් දීර්ඝ කළ හොත් උසස් ගණයේ හා පහත් ගණයේ සතුන් වෙන් කර ගැනීමට අපට පිළිවන් වේ.

එනම් පණ බේරා ගැනුම් වස් ඔවුන් සතු යම් යම් තේරීම් හැකියාවනට අනුව ය. ඒ නිසා පහත් ගණයේ ජීවියකුට වුව ද කුසල කර්මයන් නිර්මාණය කිරීමේ විභව්‍යතාව ඇත. කුසල කර්මයන් ක්‍රමානුකූලව වර්ධනය කිරීම නිසා සත්වයකුට ඉහළ තත්වයකට පැමිණිය හැකි ය.

මේ කාරණය ම වෙනත් කෝණයකින් බැලුවහොත් මුල් ම යුගයේ කථාවක් වූ බෝධිසත්වයන් පළමුවරට බුද්ධත්වය ලැබීමට පෙරුම් පිරීමට ගත් තීරණය සලකා බැලිය හැකි ය.

සිද්ධාර්ථ කුමරුන් ලෙස ඉපදීමට පෙර බුදුරදුන් ඉතා බොහෝ වාර ගණනක් සාමාන්‍ය මිනිසකු ලෙස පුනරුත්පත්තිය ලබා ඇත. එක් දිනක් බෝධි සත්වයෝ සිය මෑණියන් සමඟ මුහුදු යාත්‍රාවකින් යද්දී චණ්ඩ කුණාටුවකට හසුවී යාත්‍රාව පෙරළී මුහුදු බත් වූහ. තම පෞද්ගලික ගැලවීම නොතකා බෝධිසත්වයෝ සිය මව කර මත තබා ගෙන ගොඩබිම කරා පිහිනමින් රළ සමඟ පොර බැදූහ. ඉමක් කොණක් නො පෙනෙන සාගරයේ ගොඩ බිමට පහසුවෙන් ළඟා විය හැකි මඟක් නො දුටු හෙතෙම විසඳාගත නොහෙන ගැටලුවකට මැදිවිය. ඔහු ගේ නිර්භීත භාවය දුටු එක් දේවතාවෙක් කායික වශයෙන් ආධාරයට පැමිණිය නොහැකි බැවින් බෝසතුනට පහසුවෙන් යා හැකි මාර්ගය වටහා ගැනීමට සැලැස් විය. ඒ අනුව බෝධිසත්වයෝ මව සමඟ බේරී ගත්හ.

එහිදී ද බෝධිසත්වයෝ මතු බුදුවීමෙන් මිස නො නවතිමි'යි තිර ලෙස අදිටන් කර ගත්හ. මේ කතා පුවතින් නිරූපණය වන්නේ බෞද්ධයිනට තම එදිනෙදා ජීවිතයේ දී දේවතාවන්ගේ සහාය පැතීමට හැකි වීම යි. දේවතාවෝ ද සෙසු සත්වයනට උදව් කිරීමේ ශක්තිය ඇති ජීව විශේෂයකි. නමුත් ඒ බලය සීමා වී ඇත්තේ ලෞකික හා භෞතික දේවලට ය. අපේ එදිනෙදා ජීවිතයේ දී අවාසනාවන්ත සිදුවීමක දී, සැනසීමක් අවශ්‍ය වූ විට දී, රෝගයක් බියක් වැනි අවස්ථාවක දි දේවතාවන්ගේ සහාය පැතිය හැකි ය.

දෙවි දේවතාවන්ගේ සහාය පැතීමෙන් අදහස් වන්නේ අප තව දුරටත් භෞතික ලෝකය හා බැඳ තබා ඇති බව ය. අප පිළිගත යුතු සත්‍යයක් නම් අප ඉපදී ඇත්තේ භෞතික ආශාවන් හා අවශ්‍යතාවලට අසුවන සේ ය.

එබැවින් ඒ අවශ්‍යතා සීමිත පරිමාණයක් තුළ තෘප්තිමත් කර ගැනීම වරදක් නොවේ.

බුදුරජාණන් වහන්සේ මධ්‍යම ප්‍රතිපදාව පෙන්වා දී ඇත. උන්වහන්සේ එයින් පෙන්නුම් කර ඇත්තේ අප සුඛෝපභෝගී නොවිය යුතු අතර ජීවිතයේ මූලික අවශ්‍යතා මුළුමනින් ම අත් නොහැරිය යුතු බවකි.

ඉතිරිය 10 පිටුවේ ...

කේ.ශ්‍රී ධම්මානන්ද හිමි

# හෙළ කුල කත
# සම්බුදු සසුන් කෙත
# ඒකාලෝක කළ වගයි...

කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාසය
පිළිබඳ සේවා සම්මානිත
**මහාචාර්ය ඉන්ද්‍රාණී මුණසිංහ**

**ක්‍රි.පූර්ව 247 වසරේ උඳුවප් හෙවත් මග්ගසිර මාසයේ දී සංඝමිත්තා රහත් තෙරණියන් වහන්සේ ලක්දිවට වැඩම වූහ.**

ඒ රහත් තෙරණිය ලක්දිවට වැඩමවා ගැනීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ මහානාග යුවරජුගේ බිසොව වූ අනුලා දේවිය ඇතුළු පන්සියයක් ස්ත්‍රීන් පැවිදිභාවය ඉල්ලා සිටීම ය.

මිහිඳු මහ රහතන් වහන්සේගෙන් බාලපණ්ඩිත නම් සූත්‍රාන්ත ධර්ම දේශනාව ශ්‍රවණය කොට සෝවාන් ඵලයට පත් වූ අනුලා දේවිය ඇතුළු ස්ත්‍රීන් පන්සියයක් දෙනා දේවානම්පියතිස්ස රජු විසින් කරන ලද ආරාම පූජාවේ දී මිහිඳු මහ රහතන් වහන්සේට වන්දනා කිරීම පිණිස පැමිණියෝ සකෘදාගාමී ඵලයට පත්වූහ.

තමන් ඇතුළු කාන්තා පිරිස පැවිදිවීමට කැමති බව අනුලා දේවිය දේවානම්පියතිස්ස රජුට පැවසුවා ය. ඒ විස්තරය මහාවංසය සඳහන් කරන්නේ මෙලෙස ය.

**"ථෙරානං වන්දනත්ථාය දේවී තු**
**අනුලා ගතා**
**සද්ධිං පඤ්චසතිත්ථීහි දුතියං ඵලමජ්ඣගා**

**සා සපඤ්චසතා දේවී අනුලාහ මහීපතිං**
**පබ්බජිස්සාම දෙවා'ති රාජා ථෙරං**
**අවොච සො"**

රජතුමා කාන්තාවන්ගේ පැවිදිවීමේ අවශ්‍යතාව පිළිබඳ මිහිඳු මහරහතන් වහන්සේට පැවසූ විට උන්වහන්සේ කියා සිටියේ,

"න කප්පති මහාරාජ පබ්බාජේතුං තථියො හි නො" යනුවෙන් තමන්ට ස්ත්‍රීන් පැවිදි කරවීමට කැප නැති බවයි.

සංඝමිත්තාගමනයේ කතාන්දරය දිග හැරෙන්නේ මෙතැන් සිට ය. ඒ හා සම්බන්ධ පාලි ගාථා ද, සිංහල අර්ථය ද මහාවංසයෙන් උපුටා පහත දක්වන්නේ පාඨකයාට මේ වැදගත් කර්තව්‍යය මූලාශ්‍රය මඟින් ම මනාව තේරුම් කර ගැනීමේ පහසුව සඳහා ය.

**"අත්ථි පාටලිපුත්තස්මිං භික්ඛුණී මෙ**
**කනිට්ඨිකා**
**සංඝමිත්තාති නාමෙන විස්සුතා සා**
**බහුස්සුතා**

**නරින්ද සමණින්දස්ස මහාබෝධි දුමින්දතො**
**දක්ඛිණං සාඛමාදාය තථා භික්ඛුණියො වරා**

**ආගච්ඡතුති පෙසෙහි රඤ්ඤො නො පිතු**
**සන්තිකං**
**පබ්බාජෙස්සති සා ථෙරී ආගතා ඉත්ථියො**
**ඉමා"**

මේ ගාථාවන්හි සිංහල අර්ථය මෙසේ ය.

"මාගේ නැඟණි වූ සංඝමිත්තා නමින් ප්‍රසිද්ධ වූ බහුශ්‍රැත වූ මෙහෙණින්නක් තොමෝ පැළලුප් නුවර ඇත්තී ය. නරේන්ද්‍රය ඕ තොමෝ ශ්‍රමණෙන්ද්‍ර වූ සර්වඥයන් වහන්සේගේ මහා බෝධි වෘක්ෂ රාජයාගෙන් දක්ෂිණ ශාඛාව ද එසේම උත්තම වූ භික්ෂුණීන් ද ගෙන වඩනා සේක්වා'යි අප පිය මහරජු කරා හසුන් යවව. ඒ ස්ථවිරී තොමෝ මෙහි අවුත් මේ ස්ත්‍රීන් පැවිදි කරන්නීය" යි රජහට වදාළ සේක."

මිහිඳු මහ රහතන් වහන්සේ සහ රජතුමා අතර මේ සංවාදය සිදුවූයේ පොසොන් මාසයේ දී ය. පොසොන් මාසයේ සිට උඳුවප් මාසය දක්වා කාල සීමාවේ දී ඇතිවන්නේ ඉහත දැක් වූ ඒ වැදගත් කාර්යද්වය සඳහා සූදානම් වීමයි. ස්ත්‍රී පැවිද්ද ලක්දිව ආරම්භ කිරීමට මඟ පෑදුණේ අනුලා දේවිය විසින් භික්ෂුණීත්වය සඳහා රජතුමාට කරන ලද ඉල්ලීම අනුව බව ද මෙහිදී මනාව පැහැදිලි වේ. සඟමිත් රහත් තෙරණිය තවත් භික්ෂුණීන් සමඟ කාන්තාවන් පැවිදි කිරීම සඳහා පැමිණීමේ දී බෝ රදුන්ගේ දක්ඛිණ ශාඛාව ද වඩමවා ගෙන එන ලෙස ධර්මාශෝක රජතුමාට දන්වා යවන මෙන් මිහිඳු මහ රහතන් වහන්සේ දේවානම්පියතිස්ස රජතුමාට දන්වා සිටි ආකාරය එය පැවසූ ආකාරය මෙහි දෙවන පරිච්ඡේදයේ සාකච්ඡා කර ඇත.

ලක්දිවට බුදු දහම ගෙන ඒමෙන් පසුව සංඝමිත්තා රහත් තෙරණියන් යටතේ පැවිදි භාවය ලබා ගෙන බුදු සසුනේ මාර්ගඵලාවබෝධය ප්‍රථමයෙන් ම ලබා ගන්නා ලද්දේ කාන්තාවන් විසිනි.

භාරතයේ සිට ඉතා දුෂ්කර ගමනක යෙදෙමින් ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ දූත මෙහෙවර කරන ලද්දේ ද කාන්තාවක විසිනි. ශ්‍රී ලංකාවේ බෞද්ධ ජනතාවගේ ගෞරවයට ද පූජනීයත්වයට ද පත් වූ ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව ලක්දිවට වැඩමවන ලද්දේ ද කාන්තාවක විසිනි. මේ සියල්ලට ම මුල් වූයේ උඳුවප් මාසයේ සිදු වූ සංඝමිත්තා රහත් තෙරණියන් වහන්සේගේ ලංකා ගමනය යි. එබැවින් ම උඳුවප් මාසය බෞද්ධ ජනතාවට ඉමහත් සේ වැදගත් වේ. උඳුවප් පුන් පොහොය ශ්‍රේෂ්ඨ ආගමික දිනයකි.

සංඝමිත්තා රහත් තෙරණියන් සහ ශ්‍රී මහා බෝධි ශාඛාව ලක්දිවට වැඩම කරවා ගෙන ඒම සඳහා දේවානම්පියතිස්ස රජතුමා දඹදිව පැළලුප් නුවරට දූත පිරිසක් යවන ලද්දේ වප් මාසයෙහි ශුක්ල පක්ෂයෙහි දෙවන දවසේ බව මහ මහාවංසය සඳහන් කර ඇත.

දඹදිව ගිය එම දූත පිරිසෙහි නායකයා වූයේ අරිට්ඨ කුමාරයා ය. පැළලුප් නුවරට පැමිණි අරිට්ඨ කුමරු ප්‍රමුඛ පිරිස රජතුමාගේ එම පණිවිඩය ධර්මාශෝක අධිරාජයාට දන්වා සිටියහ. ඒ පණිවිඩය සමන්තපාසාදිකා විනය අටුවාවෙහි බාහිර නිදානයේ විස්තරාත්මක ව මෙලෙස දැක්වේ.

"පුත්තො තෙ දෙව මහින්දථෙරො ඒවමාහ" සහායස්ස කිර තෙ දේවානම්පිය තිස්සස්ස රඤ්ඤෝ භාතුජාය අනුලා නාම දේවී පබ්බජිතුකාමා, තං පබ්බාජෙතුං අය්‍යං සංඝමිත්තථෙරිං පහිණාථ, අය්‍යායෙව ච සද්ධිං මහාබෝධිංති"

මෙහි සිංහල අර්ථය සමන්තපාසාදිකා විනයට්ඨකතා සිංහල පරිවර්තනයෙහි මෙලෙස දක්වා ඇත.

"දේවයන් වහන්ස, ඔබගේ පුත්‍ර වූ මහා මහින්ද මහා ස්ථවිරයන් වහන්සේ ඔබ වහන්සේගේ යහළු වූ දේවානම්පියතිස්ස රජුගේ සොහොයුරුගේ බිරිඳ වූ අනුලා නම් දේවී තොමෝ පැවිදිවනු කැමැත්තී ය. ඇය පැවිදි කරන්නට ආර්ය සංඝමිත්‍රා ස්ථවිරියන් එවනු මැනවි. ඒ ආර්යාව සමඟ ම මහා බෝධියත් එවහු'යි දන්වන්නට මට නියම කළ සේක් යැයි කීයේ ය."

ධර්මාශෝක අධිරාජයා තම දියණිය වූ සංඝමිත්තා රහත් තෙරණිය ලක්දිවට යැවීමට කැමති නොවුව ද බුදු දහම ලක්දිව පතුරුවාලීමේ පරම උතුම් අදහසින් ම දේවානම්පියතිස්ස රජුගේ ඉල්ලීමට එකඟ විය. ඒ බව සඳහන් කරන සමන්තපාසාදිකාව, සංඝමිත්තා රහත් තෙරණියන්ගේ අදහස මෙලෙසින් දක්වා ඇත.

"මහරජ, මාගේ සොහොයුරුගේ වචනය මට බර ය. අනුලා ක්ෂත්‍රිය තොමෝ ද දහසක් ස්ත්‍රීන්ගෙන් පිරිවරන ලද්දී පැවිද්ද පිණිස උපන් ආශාව පෙරටුකොට ඇත්තී මා එනු බලාපොරොත්තු වේ. මහරජ, එහෙයින් මම එහි යමි'යි සංඝමිත්තා තොමෝ කියා සිටියා ය. 'එසේ නම් දුව! මහා බෝධියත් ගෙන යව' යි අධිරාජ්‍යයා කීයේ ය."

සමන්තපාසාදිකා විනයට්ඨකථාවේ සඳහන් ඉහත විස්තර මෙහි දැක්වූයේ සංඝමිත්තා රහත් තෙරණියන් ගේ ලංකාගමනයට බලපෑ ප්‍රධාන හේතූන් පැහැදිලි කිරීමට ය. තෙරණියන් වහන්සේ ලක්දිවට වැඩම වූයේ 'දේවානම්පියතිස්ස රජුගේ සොහොයුරුගේ බිරිඳ වූ අනුලා දේවිය තොමෝ පන්සියයක් කන්‍යාවන් හා පන්සියයක් ඇතුළු පුරවැසි ස්ත්‍රීන් සමඟ පැවිදිවනු කැමැත්තී ය. මාගේ ඊම බලාපොරොත්තු වෙති. මහරජ එහෙයින් මම හෙළදිවට යමි" යන අදහසිනි.

ශ්‍රී මහා බෝධි ශාඛාව ද වඩමවන ලෙස ධර්මාශෝක අධිරාජයා තෙරණියන්ට යෝජනා කළේ ඉන් පසුව ය. මිහිඳු මහ රහතන් වහන්සේගේත්, දේවානම්පියතිස්ස රජතුමාගේත් පණිවිඩය වූයේ "පැළලුප් නුවරට ගොස් මහා බෝධිය සමඟ ආර්ය සංඝමිත්‍රා ස්ථවිරීන් මෙහි (ලක්දිවට) කැඳවාගෙන ඒමයි."

රජතුමාට මේ සිද්ධිය සිහිපත් ව ඇත්තේ වස්සාන කාලය තුළ දී බව මහාවංසයේ සඳහන් වේ.

දඹදිව සිට ලක්දිවට ශ්‍රී මහා බෝධි ශාඛාව වැඩම කිරීම සහ ලක්දිව කාන්තාවන් පැවිදි කිරීම පිළිබඳ කතාන්දරය මෙතැන් සිට මහාවංසයෙන් සහ වංසත්ථප්පකාසිනියෙන් සාකච්ඡා වේ.

සන්දේශය රැගත් අරිට්ඨ කුමරු ඇතුළු පිරිස දඹදිවට යෑමට දඹකොළ පටුනෙන් පිටත් වූයේ අස්සයුජ මාසයේ දී ය. ඉන්දීය චන්ද්‍ර මාස ක්‍රමය අනුව අස්සයුජ මාසය යනු සැප්තැම්බර් මස පුර පොහෝ දින සිට ඔක්තෝබර් මස පුන් පොහෝ දින දක්වා කාලය යි. එය චන්ද්‍රයා වැඩෙන පසළොස්වන දිනය පුරපක්ෂය නමින් හැඳින් වේ. එසේ නම් සංඝමිත්තා තෙරණියන් වහන්සේ ලක්දිවට වැඩම කරවීම පිළිබඳ සන්දේශය දේවානම්පියතිස්ස රජතුමා ධර්මාශෝක අධිරාජයාට යවා ඇත්තේ වප් පුර පසළොස්වක පොහොය දිනයට පසු දෙවන දිනයේ දී ය.

*ඉතිරිය 10 පිටුවේ ...*



බුදුසරණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

### උඳුවප් පුර අටවක 2022-11-30

## දැන යායුතු මඟ

තමන් අන් සියල්ලන්ටම වඩා අංග සම්පූර්ණ බව බොහෝ දෙනෙක් සිතති. ගේ දොර, මිල මුදල්, ධන ධාන්‍ය, නිලතල, කීර්ති - ප්‍රශංසා ඇති පමණින් ඒ තීරණය ගනිති. එහෙත් ඒ සිතිවිල්ලම වැරැදි ය. පුද්ගලයකු අංග සම්පූර්ණ වන්නේ භෞතික සම්පතින් සේ ම ආධ්‍යාත්මික සම්පතින් ද වර්ධනය වූ තරමට ය. බෞද්ධ ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දී ඇත්තේ මිනිසා ස්වභාවයෙන් ම සම්පූර්ණ නොවන හෙයිනි.

ආචාර ධර්ම ගැන දැනුම්වත් කළ ද, මොනතරම් අවවාද අනුශාසනා ලැබ දුන්න ද, මිනිසා යහපත් වන්නේ නැත. යහපත් පුද්ගලයෙක්, අංග සම්පූර්ණ මිනිසෙක් වීමට නම් ඒ ආචාර ධර්ම තම තමන් ම තම ජීවිතයට පුහුණු කළ යුතු ය.

අපේ දරුවන් දෙස බලමු. දරුවන් පළමුව ජීවිතය ඉගෙන ගන්නේ තම පුබ්බාචාර්යවරුන් වන මවුපියන්ගෙනි. බොහෝ මවුපියන් ගුණ ධර්ම ගැන දරුවන්ට නිති අවවාද කළ ද, නො හික්මුණු තැන දරුවන්ට තරවටු කළ ද, දඬුවම් ලබා දුන්න ද, බොහෝ දරුවන් යහ ධර්මතා ජීවිතයට ප්‍රායෝගික කරගනු නො පෙනේ. එසේවීමට නම් මවුපියන් ඒ මඟ යමින් දරුවන්ට ආදර්ශවත් විය යුතු ම ය. කකුළු මව ඇදට ගමන් කරමින් සිය දරුවන්ට කෙළින් යන්න යැයි කීවාට කිසි දිනෙකත් ඒ අවවාදය එල සහිත නොවන්නාක් මෙනි.

බෞද්ධ ආචාර ධර්මවල මූලික පදනම පංච ශීලය ලෙස හඳුනාගත හැකි ය. එය බෞද්ධ ගිහියා විසින් රැකිය යුතු නිත්‍ය ශීලයකි. මේ ශික්ෂා පද සියල්ලෙන් ම කියන්නේ අකුසලයෙන් වැළකීම පිළිබඳ ය. අපමණ යහපත් දේ කිරීම පිළිබඳව ය. ධම්ම පදයේ සඳහන් ලෙස අකුසල් නොකිරීම, කුසල් කිරීම, තම සිත පිරිසුදු කර ගැනීම කළ යුතු බව සියලු බුදුරජාණන් වහන්සේගේ අවවාදය වේ.

ලෝබ, ද්වේෂ, මෝහ යනාදී අකුසල මූලයන් නිසා නිර්මාණය වන මමත්වය අකුසල ක්‍රියාවන්ට මුල ය. ඒ අකුසල ක්‍රියා බෞද්ධ ආචාර ධර්මයන්ට පටහැනි ය. තමන් කරන ක්‍රියා සීලයට පිටු නොපාන, පරිත්‍යාගයෙහි, දානයෙහි, කරුණාවෙහි හා ප්‍රඥාවෙහි මුල්බැස ගත් සිතින් වේ නම් ඒවා පින් ක්‍රියාවන් ය. එසේත් නැතිනම් කුසල කර්මය. එහෙයින් බෞද්ධයා අකුසල මුල් දුරින් දුරු කොට කුසල් සිතිවිලි වර්ධනය කරන්නට උත්සාහ ගත යුතු ම ය.

බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ යම් පුද්ගලයෙක් යහපත් ක්‍රියාවක් කරන්නේ ද, අයහපත් ක්‍රියාවක් කරන්නේ ද තමන්ම ඊට වගකිව යුතු බව ය.

අනුන් නිසා හෝ අයහපතක්, වරදක්, පවක් කළේ නම් එහි විපාක මවුපියන්, නෑදෑයන් දරුවන්, මිතුරන් ආදී වශයෙන් කිසිවෙක් නොවිඳිති. තමන්ට ම විඳින්නට සිදුවේ.

සම්බුදු දහම අනුව යම් කෙනෙක් පාපයක්, වරදක්, අයහපතක් කළේ නම්, එහි පරාභවය, දුක සේ ම අසතුට ද විඳින්නට සිදුවේ.

බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ තමන් වහන්සේ දේශනා කරනු ලබන අවවාද, තමන්ගේ නුවණින් කල්පනා කොට බලා සුදුසුනම් භාවිත කරන ලෙස ය. උන්වහන්සේ හොඳ නරක ක්‍රියාවන්හි විපාක පෙන්වා දුන්නා මිස තමන් වහන්සේගේ අවවාද අනුශාසනා පිළිපදින ලෙස අණ නොකළහ.

බොහෝ දෙනෙක් දහම් මඟ යනවා යැයි සිතන්නේ, අමූලිකා ශ්‍රද්ධාවෙන්, ආමිෂ පූජාවන්හි ම නිරත වෙමින් කටයුතු කිරීම ය. ඔවුහු කිසිදු ධර්ම කරුණක් ප්‍රායෝගිකව පුහුණු නොකරති. බෞද්ධයා උත්සාහ ගත යුතු නොහික්මුණු ගති දුරු කොට, ශිෂ්ට සම්පන්න පුද්ගලයකු ලෙස අවබෝධය ඇතිව දහම් මඟ යාමට ය. බුදු දහම දැන යා යුතු ධර්ම මාර්ගයකි.

# සාර්ථකත්වයේ රහස නිරවුල් සිතයි

**මා මහණ වූ අලුත වාසය කළේ තායිලන්තයේ වන සෙනසුන්වල යි. මේ වන සෙනසුන් පිහිටා තිබුණේ තායිලන්තයේ ඝන වනාන්තරවලයි.**



**අජාන් බ්‍රහ්මවංසෝ හිමි**

මේ ඝන වනාන්තරවල දරුණු කැලෑ සතුන් වාසය කළා. ඒ හැර විෂ සහිත ගෝනුස්සන්, පත්තෑයන්, දිවි මකුළුවන් වගේ සතුන් ද සිටියා. මේ සර්පයන්, ගෝනුස්සන්, පත්තෑයන් වැනි සතුන් අප වසන කුටි අවට නිතර දකින්න ලැබුණා. මොවුන් බොහෝවිට අනතුරුදායක සතුන්. සමහර සතුන් දෂ්ට කළොත් මරණය අත්වන්න ඉඩ තිබුණා අතර සෑම සතකුම දෂ්ට කිරීමෙන් දරුණු වේදනාවක් අත්විඳින්න සිදුවෙනවා.

තමන්ගේ කුටිවල වසන හාමුදුරුවන්ට දාන ශාලාවට අනතුරක් නැතිව වඩින්න, කැලෑවේ එහා මෙහා යන්න ගම්වැසියන් කැලෑව එළිකර අඩිපාරවල් වගේ කුඩා මංමාවත් තනා දී තිබුණා. මේ මංපෙත් අතුගා පිරිසුදු කර තැබීම හාමුදුරුවන් වූ අපේ වගකීම වී තිබුණා. මේවා පිරිසුදුවට තබා ගත්තම පාර හරහා යන සර්පයන්, පත්තෑයන් වැනි විසකුරු සත්තු දැක ගෙන ප්‍රවේශමෙන් එහා මෙහා යන්නට අපට හැකිවුණා. තායිලන්තයේ මේ කියන ප්‍රදේශවල පොළව සුදුවැලිවලින් ගහණයි. මේ නිසා කැලෑව කපා පාරවල් සෑදුවාම මේවායේ සුදුවැලි තලාව මතු වී තිබෙනවා. පාර අතුගෑවාම සුදු පීත්ත පටියක් වගේ පාර පිරිසුදුවට පෙනුණා.

අජාන් චා හාමුදුරුවන්ගේ උපමාව මෙහෙමයි

ඔබට ගසක කොළයක් ගැන මෙනෙහි කරන්න ඕන වුණාම, ඒ කියන්නේ කොළයේ වර්ග, රටාව පැහැපත් බව ආදී කරුණු ගැන හොඳින් සිත අවධානය යොමුකොට මෙනෙහි කරන්න අවශ්‍ය වුණාම, කැලෑවේ සුදු වැලි පාරේ වැටුණු කොළයක් මෙනෙහි කිරීම පහසුයි. වන ලැහැබක කටු අකුළක පටලැවී තිබෙන ගසක අත්තක තිබෙන කොළ යක් ඒ විදිහට මෙනෙහි කරන්න අමාරුයි. එවැනි කොළයක් බොහෝ කොළ, අතු, ඉති, අතර තිබෙන නිසා සුදු වැල්ලෙ අතුල කොළයක් වගේ මෙනෙහි කිරීම අපහසුයි. එවැනි කොළයක යථා ස්වභාවය හඳුනාගැනීම අපහසුයි. මක්නිසාද යත් ඒ කොළය, කොළ ගහනයක තිබෙන තවත් කොළයක් නිසයි.

එහෙත් සුදුවැලි අතුල පාරක, කොළයක් පතිත වුණාම විශේෂයෙන් හොඳින් අතු ගා පිරිසුදු කළ, සුදු වැලි අතුල පාරක කොළයක් පතිත වුණාම, සුදු වැලි පසුබිමේ තිබෙන කොළයේ නාරටි, රේඛා, පැහැය, නැම්ම හඳුනා ගැනීම පහසුයි. එසේ වන්නේ එවැනි පසුබිමක තිබෙන කොළයක් මෙනෙහි කිරීම පහසු නිසයි. කොළයේ හැඩහුරුකම, වර්ණය ගැන හොඳ වැටහීමක් මෙනෙහි කිරීමෙන් ලබා ගන්න පුළුවන් නිසා එය වටහා ගැනීම පහසුයි.

අපේ ජීවිතයේ සිදුවන සිදුවීම් ද මේ වගේම යි. ජීවිතයේ සිදුවීම් බහුලයි. බොහෝ සංකීර්ණයි. ඒ සංකීර්ණ බව නිසාම අවුල් සහගතවීම, පැටලැවිලි සහගතවීම නිසා අපට කිසිවක් තේරුම් ගන්න බැරි වෙනවා. එවිට ජීවිතය බොහෝ අතු පතරින් සෑදුණු, පටළැවිලිවලින් ගහන කටු අකුලක් වගෙයි. වන ලැහැබක් වගෙයි. මේ නිසා කිසිවක් තේරුම් බේරුම් කර ගන්න බැරි වෙනවා.



මේ නිසා අජාන් චා හාමුදුරුවන්ගේ උපමා කතාවේ වගේ අපට කිසිවක් ගැන මෙනෙහි කරන්න පෙර අපේ සිත, අපේ මනස සරල කර ගැනීම අවශ්‍ය වෙනවා. සැබැවින් ම සිදුවන්නේ කුමක්දැයි මෙනෙහි කර බැලීමට හැකිවන්නේ එවැනි අවුලෙන් තොර, සරල සිතක් ඇතිවිටයි. භාවනාවේ දී අප කරන්නේ සිතේ මේ අවුල නැති කර සිත සංසුන් කර ගැනීමයි. සිත සරල කර ගැනීමයි. සිතේ වේගය අඩුකර ගැනීමයි. මේ සඳහා බොහෝ දේ කෙරෙහි අවධානය යොමු නොකොට කිසියම් කාරණයක්, හෝ දෙකක් පිළිබඳ අවධානය යොමු කිරීම සුදුසුයි.

අපට හුඟාක් දේ ගැන සිතන්න තිබෙනවා යැයි සමහරු මැසිවිලි කියනවා. ඔවුන් බොහෝ සංකීර්ණ නිසා, අවුල් සහගත නිසා කිසිවක් ගැන නිරවුල්ව සිතන්න බැහැ. මෙනෙහි කරන්න බැහැ. මෙසේ වන්නේ එකම වේලාවක බොහෝ දේ කරන්න යෑමෙනුයි. අප බුදුදහම භාවිත කරන විට අපට අපේ සිත සංසුන් කර ගන්න හැටි, සිතට විවේකයක් දෙන හැටි ඉගෙන ගන්න ලැබෙනවා.

සිත නිරවුල් වූ විට වැඩ කටයුතු සාර්ථක වෙනවා

සිත එකවර නොයෙකුත් දේ සඳහා යෙදවීම අවශ්‍ය වන්නේ නැහැ. එක්වරකට එක දෙයක් ගැන පමණක් අවධානය යොමු කිරීමෙන් සිත සන්සුන් කර ගන්න පුළුවන්.

මෑතකදී මට ඇඩිලේඩ් නුවරදී හමු වූ ලොකු ව්‍යාපාරිකයෙක් තමන්ට භාවනා කරන්න විවේකයක් නැති බව කීවා. ඒ තරම් කාර්යබහුල බවත් කිව්වා.

“ඔබ වැනි කාර්යබහුල පුද්ගලයකුට භාවනාව ඉතා අත්‍යවශ්‍ය බව“ මා කිව්වා. එසේ වූ විට ඔබ තුළ නිරවුල්වීමක් ඇති වෙනවා. එසේ වූ විට ඔබට ඔබේ ව්‍යාපාර කටයුතු පිළිබඳව ද අවධානයෙන් සිටීම, මෙනෙහි කිරීමට හැකිවන බවත් මා ඔහුට කීවා.

මනස පුහුණු කළ විට මනස තියුණු වෙනවා. එවිට අනෙක් පුද්ගලයන් ගැඹුරින් දකින්න පුළුවන්. වඩාත් ඵලදායී ලෙස මෙනෙහි කරන්න පුළුවන්. ඒ තුළ සිතේ සංවේදී බව, විචක්ෂණශීලී බව ඇතිවෙනවා. එය ජීවිතය සාර්ථක කර ගැනීමේලා වඩාත් වැදගත් වනවා.

පරිවර්තනය
**සමරසිංහ ගුණසේකර**

# තමන්ගේ අයිතිය තමන්ට ම අහිමි කල

# අනුන්ගේ අයිතිය පතන්නේ කුමට ද?

"පුත්තා මත්ථි ධනංමත්ථි
ඉතිබාලො විහඤ්ඤති
අත්තා හි අත්තනො නත්ථි
කුතො පුත්තා කුතො ධනං"

අනුවණ පුද්ගලයා මට දරුවෝ ඇත. ධනය ඇත. කියා සිතමින් වෙහෙසෙයි. තමාට තමාත් නැති කල කුමන පුත්තු ද? කුමන ධනය ද?

මේ අපි කියවමින් සිටින්නේ බාල වග්ගයේ බුද්ධ වචන බව සිහියට නගා ගැනීම වැදගත් ය.

බොහෝ ජනයා තම කුලය, අගේ කොට සලකති. එහෙයින් තම කුලය රකින්නේ කුලය පිරිසුදු කරන්නේ, තම මවුපියන්ගේ සිත් පුරවන්නේ පුත්‍රයා ය යන අදහස මෙහි ගැනේ. ධර්මයේ පුත්‍රයන් සිවු දෙනෙක් ගැන විස්තර ඇත.

අත්තජ :– තමා නිසා උපන්, ඛෙත්තජ :– තම ලයෙහි උපන් ( දරු ස්නේහය මුල්කොට) අන්තෙවාසික – තමා වෙතින් ශිල්ප ශාස්ත්‍රාදිය උගත් ( උගත් – නැණවත් – දක්ෂ තම ශිෂ්‍යයකු මුල්කොට) දින්නක : අන්දරු තමා විසින් හදා වඩා පෝෂණය කළ යනුයි.

මෙහි තම ලෙයින් උපන් අත්තජ පුත්‍රයා සැලකේ. මොවුන් අතර ද තමාගේ ගුණ නුවණින් මවුපියන් ඉක්මවා සිටියේ – අධික ගුණ නුවණ ඇත්තේ, ධන ධාන්‍යයෙන් වැඩී සිටියේ, තම වංශය මවුපියන්ටත් වඩා ධ්වජයක් මෙන් ඔසවා තැබුයේ අනුනට ද හිතවත් වූයේ, අතිජාත නම් වේ.

මේ සියල්ලෙන් තම මවුපියන්ට අනුරූපව සිටියේ අනුජාත නම් වේ.

මව්පියන්ට වඩා මේ සියල්ලෙන් පහත් ව සිටියේ අවජාත නම් වේ.

නුවණැති දෙමව්පියෝ අතිජාත, අනුජාත පුත්‍රයන්ට කැමැති වෙති. මෙහිලා ද මට පුත්‍රයෝ ඇතැයි මවුපියන් සතුටු වන්නේ මේ දෙදෙනා ගැන ම ය.

එහෙත් මෙම ගාථාවෙන් කියැවෙන්නේ එම සතුටු ද මුලාවක් බව සිහියට ගත යුතු බව ය. දූවරුන් ද මෙසේ ම ය)

'ධනං මේ අත්ථි:–නම් මට ධනය තිබෙන යන්න ය.

මෙහිලා ධනය නම් තමා සතු චංචල හා අචල වස්තු ය. කෙනකු සතු, තමාගේ පැවැත්මට හා දියුණුවට අදාළ මිල මුදල් – ඉඩකඩම්, ගේ දොර, වතුපිටි, යාන වාහන, රන්, රිදී හා තැන්පත් යන හැම දෙයක්ම මේ ධන ශබ්දයට ඇතුළත් වෙති.

ඉති බාලො විහඤ්ඤති නම් මේ මෝඩයා (මිනිසා) නැසී යන්නේ යන අරුත යි.

මෙහි බාලයා යනු මෝඩයා ය. අඥානයා ය. මෙලොව පරලොව නොදන්නා ය. විහඤ්ඤති යනු නැසී යන්නේ ය. දුකට පත්වන්නේ ය යනුයි. දරුවන් හා ධනය ඉපැයීමට යාමෙන් ය.

අත්තාහි :–යනු තමා ය.එය සම්මුති කතාවලට අයත් පදයකි. පරමාර්ථ ධර්ම කතා තුළ "තමා" යනුවෙන් පුද්ගලයෙක්, සත්ත්වයෙක්, ආත්මයක් නැත. එහි එන්නේ ස්කන්ධ නාමය යි. භවයෙන් භවයට යන්නේ මේ උපාදාන කොටගත් ස්කනධ පහයි.

අත්තනො නත්ථි යනු තමාත් නැත යනුයි. එනම් සම්මුති වශයෙන් "තමා" කියා කෙනෙක් සිටියත්, ඔහු ඔහුගේ පාලනයෙන්, මෙහෙයවීමෙන් තොර බව ය. උදාහරණ වශයෙන් ගන්නේ නම්, තමාට තමාගේ දිරීමට යාම (වයසට යාම) වළක්වා ගත හැක්කේ ද? නවත්වා ගත හැක්කේ ද? නො පුළුවනි. ලෙඩවීම, ඇඟරැළි වැටීම, දත් වැටීම, කළු කෙස් සුදුවීම, මරණයට පත්වීම, වළක්වාලිය හැක්කේ ද බැරි ය. ඒ මක්නිසා ද ? තමා යැයි කෙනෙක් නැත. මේ බව තේරුම් නොයන තාක් ඔහු මෝඩයෙකි. අඥනයෙකි. මෝහයෙන් මුලා වූවෙකි. සද්ධර්මාවබෝධය ලැබිය යුත්තේ මේ සඳහා ය.

"පුත්තා කුතො යනු – එසේ නම් පුත්‍රයෝ යනුවෙන් පිහිටට කෙනෙක් වෙත් ද යන්නයි. නැත.

ධනං කුතො නම් ධනය යනුවෙන් පිහිටට යමක් වේ ද යනුයි. නොවේ. එය ද නොවේ ම ය.

කොපමණ පුත්‍රයෝ සිටියත්, දූවරු සිටියත්, හිතවත් ධනවත්, බලවත් ඥාති සමූහයා කොපමණ සිටියත්, බලවත් මිත්‍රයන් කොපමණ සිටියත්, ඒ කිසිවකුට හෝ කිසිවකට තමාගේ දිරායාම, ලෙඩවීම, ඇස් පෙනීම අඩුවීම, දත් වැටීම, හිස කෙස් සුදුවීම, කය දුබලවීම, මරණයට පත්වීමාදි ස්වභාව ධර්ම ක්‍රියාවලියන් කිසිවක් නවතාලිය හැක්කේ ද?

නො හැක්කේ ම ය.

කිසිසේත් නොහැක්කේ ම ය.

මෙපමණක් නොවේ. අනෙක් සියල්ලට වඩා දවසට දෙතුන් වරක් සෝදා , කවා පොවා, ශීත උෂ්ණාදියෙන් ගලවා ගත් ඇඳුම් ආයිත්තම්වලින් සරසවා ලූ, කුසගින්නෙහි නොතබා උපස්ථාන කළ මෙතෙක් කල් "මම වෙමි" "මගේ වෙමි" වශයෙන් සැලකූ මේ ආත්මයවත් (කයවත්) තමාට ස්නේහයක් නැතිකොට පුත්‍රයන්ගෙන් දූවරුන්ගෙන්, අඹුවගෙන්, පුරුෂයාගෙන් ධනයෙන්, එවනැන්නක් බලාපොරොත්තු විය හැකි ද? මේ කවරෙක්වත් තමන් දුකින් රැක ගන්නට අපොහොසත් ය. එබැවින් තෙමේත් තමාට නැත. යමෙක් මෙසේ නොසිතා තමාට දරුවෝ ඇත. ධනය ඇතැයි සිතයි ද එය කෙතරම් අඥානකමක් වේ ද? මෙවැනි අදහසක් මේ ගාථාවෙන් අපට කියා දේ. එදා මෙන් අදත් කෙනෙක් ධර්මය සොයා යන්නේ මේවා අතහැර ය.

දැන් මේ උතුම් ධම්මපදය අනුත්තර බුදුරජාණන් වහන්සේ කවර කාරණයක් මුල්කොට දේශනා කළේ දැයි අටුවා කථාව කියවා බලමු.

(ධම්මපද අටුවා කථා අංක 47)

ආනන්ද නම් සිටුවරයකු සැඬොල් කුලයක ඉපදේ

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර වැඩ වාසය කරන කල එනුවර ම ආනන්ද නම් වූ බලවත් මසුරු සිටුවරයෙක් විසීය. ඔහුට හතළිස් කෝටියක් පමණ ධනය විය. ඔහු කැඳවා අඩමසකට වරක් පමණ තම ඥාතීන් ඉදිරියේ "මුලසිරි" නම් තම පුතු කැඳවන්නේ ය.

පුත, මේ ධනය හතළිස් කෝටියකි. එසේ වුවත් එය ලොකු ධනයක් සේ නොසලකන්න. දවසකට එක කහවනුවක් වියදම් කළත් කලක දී මේ ධනය ක්ෂය වී යන්නේ ය. එහෙයින් තව තවත් ධනය රැස් කරන්න. වියදම් නොකරන්න ආදි වශයෙන් අවවාද කළේ ය.

මේ අතර තමන්ගේ පංච මහා නිධාන ගැන ද පුතාටවත් නොකියාම මසුරු බලයෙන් ම ඔහු කලුරිය කළේ ය. මරණින් මතු සැඬොල් පවුල් දහසක් ඇති ගමක එක් චණ්ඩාලියකගේ කුස පිළිසිඳ ගත්තේ ය. සිටුවරයා ගේ මරණය ගැන ඇසූ රජු, මූලසිරි පුතා ගෙන්වා සිටු තනතුර දුන්නේ ය.

මේ මියගිය ආනන්ද සිටු සැඬොල් ස්ත්‍රියකගේ කුස පිළිසිඳ ගත් දා සිට ඒ ගමේ කිසිවකුට බැළමෙහෙ පවා නැතිවුණි. අනුන්ගෙන් ලැබෙන බත් ටිකක් වුව ද නොලැබෙන තත්වයක් මතුවුණි. ඔවුහු අප අතර කාලකන්ණියකු සිටී යැයි නිගමනය කළහ. එදින පිරිස දෙකොටසකට, වෙන් කරමින් දෙදෙනකු දක්වා ගොස් කීප දිනක දීම මසුරු සිටු පිළිසිඳ ගෙන සිටි කාළකණ්ණි මව තෝරා ගත්හ. වෙන් කර තැබූහ. ඉන්පසු අනෙක් අයගේ අපහසුතා මඟහැරුණි. මේ මවට ද මොහු පිළිසිඳ ගත් දා සිට යැපෙන පමණටවත් ආහාර නැති විය.

නිසි කල ආ විට ඇය අංග විකල පුතකු බිහි කළා ය. මොහුගේ මුහුණේ පැවැති මේ විකලාංග නිසා විරූපියෙක් ද විය. එහෙත් මවකගේ දරු ස්නේහය නිසාම තම කුසෙන් උපන් දරුවා අත් නොහළාය.

ඉතා දුක සේ පෝෂණය කරන්නට වූවා ය. දරුවාත් සමඟ මඟට බැස්ස විට කිසිවක් නො ලබන්නී ඔහු ගෙදර රඳවා තනියම යන දවස්හි බැළමෙහෙ ලැබෙන්නේ ය.

මෙසේ දරුවා තනියම ඇවිද ජීවත්වීමට ලැබෙන කාලය එළැඹුණි. ඒ මව තම පුතුට කබලක් අතට දී "පුතේ ඔබ නිසා අපි මහත් සේ දුක් වින්දෙමු. දැන් ඔබ පෝෂණය කිරීම අපහසු ය. මෙනුවර යාචකයින් උදෙසා බත් දෙන තැන් ඇත. එහි ගොස් ජීවත් වන්න" යැයි පිටත් කර හැරී ය.

මෙසේ ඇවිද යන මොහු සිටු කාලයේ ජීවත් වූ සිටු ගෙදර ළඟ නතර වුණි. ඒ පෙර විසූ පුරුද්දට මෙනි. සිටු මාලිගයේ සිවු දොරටුවෙන් තුන් දොරකට ගියේය. කිසිවකු නො දුටුවේ ය. සිවුවැනි දොරටුවේ දී මූලසිරි පුතා දැක හඬන්නට විය. මේ අතර මොහු දුටු මූලිසිරි සිටුගේ දරුවෝ බියව හඬන්නට විය. මෙහෙකරුවන් පැමිණ ඔහුට තළා පෙළා ඉවතට ඇද දැමූහ.

මෙවෙලෙහි ආනන්ද හිමියන් සමඟ පිඬු සිඟාවඩින බුදුරජාණන් වහන්සේ මෙම සිද්ධිය දුටු සේක. ආනන්ද තෙරුන් වහන්සේ දෙස බැලූ සේක. ආසන්නයට පැමිණ විට පහරදී ඉවතට ලා සිටි අය ගැන සියලු තොරතුරු ආනන්ද හිමිට වදාළ සේක.

මෙහිදී තෙරුන් වහන්සේ මූලිසිරි සිටු බුදුරජාණන් වහන්සේ ළඟට ගෙන්වූ විට අවට සිටි බොහෝ අය ද රැස්වූහ.

මේ කවරෙකැ"යි ඔබ දන්නේ දැයි විචාළ සේක. නොදනිමියි කී ය.

මොහු ඔබගේ පියා ආනන්ද සිටුවරයා යැයි බුදුරජාණන් වහන්සේ වදාළ සේක. එය නොඅදහන බව දැන ආනන්ද සිටුවරයා ඔබේ පුතාට පඤ්ච මහා නිධාන ඇති තැන් කියන්න දැන්වීය. එහිදි පියා හඳුනා ගැනීම තහවුරු කළහ. මෙහිදීම මුලසිරි සිටු පුතා බුදුන් සරණ ගියේ සරණ ශීලයෙහි පිහිටියේ ය.

මෙහිදී භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ඉහත ගාථාව මුල්කොට දහම් දෙසු සේක. ධර්ම දේශනාවසානයෙහි බොහෝ දෙනාට ධර්මාවබෝධය වූයේ ය. දේශනාව මහජනයාට ද වැඩ සහිත විය.



ත්‍රිපිටක පරිවර්තන
මණ්ඩලයේ ලේකම්
( බෞද්ධ කටයුතු
දෙපාර්තමේන්තුව
බුද්ධශාසන අමාත්‍යාංශය)
කේ.කේ. සුගතපාල



දඹාන මාවරගල ආරණ්‍ය
සේනාසනවාසී
රාජකීය පණ්ඩිත,
ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ**
**අමරවංශ හිමි**

# අපායේ නොවැටෙන්න උපාය දැන ගන්න

**සිතුල්පව්ව විහාරයේ වැඩසිටියා සාමණේර හා උපසම්පදා භික්ෂූන් වහන්සේ බොහෝ පිරිසක්. කලක් මේ විහාරය තෙරුන් වහන්සේ දෙළොස් දහසකින් පිරී පැවතියා. සාමණේර පැවිද්ද ලැබූ තරුණයෙක් මහ තෙරවරුන්ගෙන් කමටහන් ඉල්ලාගෙන භාවනා කළා. තරුණයාගේ පැවිද්දෙන් පසු ඔහුට 'තිස්ස' යන නම ලැබුණා. අලුතින් පැවිදි වුණු නිසා උපසම්පදාව ලබා ගත්තේ නෑ.**

ටික කලක් වත් පිළිවෙත් පුහුණු වෙන්න අවස්ථාව ලබා දුන්නා. ගෙදරින් වෙන්වෙලා ඉන්න මේ තරුණ භික්ෂූන් වහන්සේට නිතර නිතර නිවැසියන් මතක් වෙන්නත්, සිවුර අත්හැර යන්නත් හිතෙන්න පටන් ගත්තා. ඒත් නැවතත් ගෙදර යන්න ඔහුට බය හිතෙනවා. දවසක් හිත දැඩි කරගෙන මෙහෙම හිතුවා.

'මම හිස රැවුල් කපන්නේ නැති නිසා, ඒ වගේම සිවුරු පිරිකර අපිළිවෙළකට තියන නිසා, මට එහෙම හිතෙනවා වෙන්න පුළුවන්. හෙට මගේ හිස රැවුල් කපනවා. පාත්‍රය සිවුරු පිළිවෙළකට තබනවා'යි හිතලා පසුදා උදෙන් ම අවදි වුණා. රාත්‍රියේ හිතපු විදිහට ම සිවුරු සෝදා වැලට දැම්මා. පාත්‍රය පිරිසුදු කර පිළිවෙළකට තැබුවා. කුටිය ලස්සනට පිළිවෙළකට සකසා ගත්තා.

හිත සංවර කර ගන්න මේ භික්ෂුවට ලොකු වුවමනාවක් තියනවා. එය යටපත් කරමින් සිවුරු හැර යන්නටත් සිතිවිලි පහළ වෙනවා. කටයුතු අවසන් කර උපාධ්‍යායන් වහන්සේ වෙත ගිහින් තෙරුන් වහන්සේට වන්දනා කළා. ඔහුගේ මුහුණේ පෙර තිබුණු ශාන්ත බව, සසුනට ඇති කැමැත්ත ආදිය නැතිවෙලා ගිහින්. බොහෝ දුකට පත් ස්වභාවයක් තමයි දැක ගන්න පුළුවන් වුණේ.

ගුරුවරයා ඔහු දුටු විගස එය දැනගෙන 'තිස්ස, ඔබ කළකිරීමට පත්වෙලා වගේ පේනවා"යි ප්‍රශ්න කළා.

එවිට තිස්ස තෙරණුවෝ ගුරුවරයා අමතමින් 'එසේ ය, ගුරුදේවයන් වහන්ස, මම මේ ශාසනයේ කළකිරිලා ඉන්නේ. මට නිතරම ගෙදර මතක් වෙනවා. එය යටපත් කර ගන්න උත්සාහ ගත්තත් එය කර ගන්න පුළුවන්කමක් ලැබුණේ නෑ"යි පිළිතුරු දුන්නා. ඒ කතාව අහගෙන හිටිය ගුරුවරයා 'හොඳයි, ඔබට ශාසනයේ පිළිවෙත් පුරන්නට අපහසු බවක් දැනෙනවා නම්, ඔබ පැවිද්දෙන් ඉවත් වෙලා යන්න. ඒත් යන්න ඉස්සෙල්ලා මට පොඩි උදව්වක් කරලා යන්න.

මං දැන් ගොඩාක් වයසයි. ඉස්සරහට මම ලෙඩ ඇඳටයි වැටෙන්නේ. ආරාමයේ එකම කුටියක්වත් නෑ පහසුකම් තියන. ඔබට පුළුවන් නම් මට හොඳ කුටියක් හදල දීලා යන්න'යි පවසා සිටියා.

තරුණ භික්ෂූන් වහන්සේට දැන් බොහොම සතුටුයි. 'ගුරු දේවයන් වහන්සේ මට යන්න දුන්නා. උන්වහන්සේගේ ඉල්ලීම මම නොපමාව ඉටු කර දෙන්න ඕන'යි හිතලා

'ස්වාමිනි, ගුරුදේවයන් වහන්ස, මම ඉතා කැමැත්තෙන් ම ඒ කටයුත්ත බාර ගන්නවා. ඉක්මනින්ම මම කුටියක් හදලා පූජා කරලා යන්නම්' යි පිළිතුරු දුන්නා.

තරුණ තෙරුන් වහන්සේගේ පිළිතුර අසා සිටි ගුරු තෙරුන් වහන්සේ නැවතත් මෙහෙම කිව්වා. 'මට බොහොම සතුටුයි, ඔබ වහන්සේ එම කාර්ය කර දෙන්න බාර ගත්ත එක ගැන. කුටියේ වැඩ ඉවර වුණාහම ගෙදර යන්න තීරණය කළානේ. ගෙදර ගියහම බණ දහම් අධ්‍යයනය කරන්න ලැබෙන එකක් නෑ.

ඒ නිසා කුටියේ වැඩ කරන ගමන් පුළුවන් හැම වෙලාවක ම ධර්මය අධ්‍යයනය කරන්න. ඒක අත්හැර දාන්න එපා. ආහ්, තව දෙයක් කියන්න තියනවා. කමටහන් ගන්න එකත් අත්හරින්න එපා. ආරාමයේ ඉන්න අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගන්න. මොහොතක් හරි හිත සංවර කර ගත්තොත් ඒක වටිනවා. ඒවා මතක තියාගෙන කුටියේ වැඩ ටික කරල දෙන්න'යි උපදෙස් දුන්නා.

දැන් තරුණ භික්ෂූන් වහන්සේට තවත් සතුටුයි. ලොකු ප්‍රීතියක් දැනෙන්න පටන් ගත්තා. ගුරු හිමියන්ගේ ඉල්ලීම ඉක්මනින්ම ඉටු කර දෙන්න තීරණය කළා. එදාම සිතුල්පව්ව කන්දට ගොඩවුණා. ලෙන් ගණනාවක් ම පරීක්ෂා කර බැලුවා. වයසට ගිය කෙනකුට වැඩ සිටීමට හැකි ලෙනක් තෝරා ගත්තා. එය වවුලන්ගෙන් හා වෙනත් සතුන්ගේ වාසයෙන් අපිරිසුදු වෙලා. කැලෑවට ගිහින් දර මිටි බැඳගෙනවිත් ලෙනට දමා ගිනි දැල්ලුවා. පසුව අළු සෝදා හැරියා. ගඩොල් ගෙනාවා. ගල්ලෙන වටේටම ගඩොල් අල්ලා බිත්ති බැන්දා. දොර, ජනෙල් තැබුවා. හුණු පිරියම් කළා. කුටිය සමීපයෙන් සක්මන් මළුවක් ද නිර්මාණය කළා. කුටියට අවශ්‍ය කරන ඇඳ, පුටු, මේස ආදියත් ගෙනත් තැබුවා. දැන් අංග සම්පූර්ණ කුටියක්. එය දකින කොට තරුණ භික්ෂුවට ලොකු සතුටක් දැනෙන්න පටන් ගත්තා. තමන් කරපු කාර්ය ගුරුහිමියන්ට කියනතෙක් හා පෙන්වනතෙක් ඉවසුමක් නෑ. වැඩ අවසන් වූ දිනම ගුරුහිමියන් හමුවට ගිහින්.

'ස්වාමිනි, ඔබ වහන්සේට වැඩ සිටින්න ලස්සන කුටියක් මම සැකසුවා. එහි වැඩම කර වැඩ සිටින්න"යි ආරාධනා කළා.

ඒ අවස්ථාවේ ගුරු හිමියෝ 'ආයුෂ්මත් තිස්ස, මම බොහොම සතුටුයි ඔබගේ අපමණ කැප කිරීම්වලට. මම ඒ කුටිය බාර ගන්නවා. එහි වැඩ සිටිමින් මගේ භාවනා කටයුතු ආදියත් මම කරනවා. මට ඔබ ගැන දැනෙන්නේ ලොකු සතුටක්. ඒ සතුට තවත් වැඩි වෙනවා මා මේ කියන කටයුත්ත ඔබ විසින් කරතොත්'යි පවසලා මෙහෙම කිව්වා.

"ආයුෂ්මත් තිස්ස, ඔබ දුක සේ තමයි මේ කුටිය කළේ. මම එය මගේ ඇස්වලින් ම දැක්කා. මම කැමතියි ඔබ එක දවසක් අලුත් කුටියේ වැඩ සිටිනවා දකින්න'යි පැවසුවා.

තිස්ස තෙරුන් වහන්සේට ගුරු හිමියන්ගේ ඉල්ලීම ඉවත දාන්න ක්‍රමයක් නැතිව ගියා.

"එසේ ය ස්වාමිනි, මම දවසක් එහි වැඩ වසන්නෙමි"යි පවසා පළමු රාත්‍රිය ගත කරන්න ගියා.

කුටියේ වැඩ සිටින තිස්ස තෙරුන්ට පුදුම සතුටක් දැනෙන්න පටන් ගත්තා. 'මම හදපු කුටිය හරිම ලස්සනයි. එහි පළමු රාත්‍රිය ගත කරන්න ගුරුහිමියෝ අවසරත් ලබා දුන්නා. උන්වහන්සේගේ ගුණ පුදුමයි.'

යනාදි වශයෙන් කල්පනා කරමින් සතුටට පත් වෙන්න පටන් ගත්තා. තමාට ලැබෙන මේ සතුට කාම ලෝකයේ සතුට බවත්, නිවසට ගියත් මෙවැනි ම සතුටක් මිස නිරාමිස සතුටක් නො පැමිණෙන බවත් කල්පනා කර විදසුන් වඩන්න පටන් ගත්තා.

එදින පහන් වන විට තෙරුන් වහන්සේ අර්හත්භාවය ලබා ගැනීමට තරම් වීර්යවන්ත වුණා. ගුරුවරයාගේ සියුම් උපක්‍රම නිසා තරුණ භික්ෂුවක් සංසාර චක්‍රයෙන් ගලවා ගැනීමට සමත් වුණා.

සිත කළකිරීමට පත්වන පුද්ගලයින්ට නැවතත් නිවැරැදි මාර්ගය පෙන්වා දෙන්න නම් උපායශීලි ව බුද්ධිමත් විය යුතු බව මේ කතා පුවතින් අපට පෙන්වා දෙනවා. මේ කතා පුවත සඳහන් වෙන්නේ අංගුත්තර නිකාය අට්ඨ කතාවේ ඒකක නිපාතයේ දෙවැනි වර්ගයේ යි.



# සම්බුදු සසුනේ ශ්‍රේෂ්ඨතම විවරණය

දිනක් බුදුරජාණන් වහන්සේ කොසොල් රට සැරි සරන අතරේ දී භික්ෂූන් වහන්සේ අරමුණු කොට අග්ගික්ඛන්ධෝපම සූත්‍රය දේශනා කළහ. මෙම සූත්‍රය ඇසූ භික්ෂූන් වහන්සේ සැට නමක් රහත් වූහ. සැට නමක් ලේ වමාරන්නට වූහ. තවත් සැට නමක් සිවුරු හැර ගිහි වන්නට විය.

මෙසේ දම් දෙසා නැවත දෙව්රම් වෙහෙරට වැඩම කළ පසු වෙහෙරේ වෙනදා මෙන් භික්ෂූන් නැති බව දුටු බුදුරජාණන් වහන්සේ ආනන්ද තෙරුන්ගෙන් කරුණු විමසී ය.

එවිට අනඳ තෙරණුවෝ මෙසේ පැහැදිලි කළහ. "භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ අග්ගික්ඛන්ධෝපම සූත්‍රය දේශනා කිරීම නිසා භික්ෂූන් වහන්සේ සංවේගයට පත් ව අපට මේ ශාසනයේ පිළිවෙත් පිරීමට නොහැකි බවත්, නොමනා පැවතුම් ඇතිව සැදැහැතියන්ගේ දන් පිළිගැනීම නුසුදුසු බවත් පවසා සිවුරු හැර ගියහ".

මේ පුවත ඇසූ බුදුරජාණන් වහන්සේ ධර්ම සංවේගයට පත්වූහ. ඉක්බිති ව අනඳ තෙරුන්ලවා භික්ෂූන් වහන්සේ රැස්කරවා මෙසේ දේශනා කළහ. ගඟකට බසින්නට බොහෝ තොටුපළවල් ඇත්තාක් මෙන්, මෙම සසුනෙහි සැනසෙන්නට බොහෝ දේ තිබෙන බවයි.

"මහණෙනි, මේ සසුනෙහි යම් භික්ෂුවක් අසුරුසනක් ගසන කෙටි කාලයක් වුව සියලු සතුන් කෙරෙහි මෙත් සිත වඩනවා නම්, මහණෙනි, ඒ භික්ෂුව මේ සසුනෙහි ධ්‍යාන ඇත්තෙක් බවට පත් වේ. දායකයින් දෙන දන් වැළඳීමට සුදුස්සකු බවට පත් වේ යැයි දේශනා කළහ.

තවදුරටත් කරුණු ඉදිරිපත් කළ බුදුරජාණන් වහන්සේ සිටගෙන හෝ ඇවිදින හෝ හිඳින හෝ නිදන හෝ යන මේ සෑම අවස්ථාවක ම මෛත්‍රී සහගත සිහියෙන් සිටිනු කැමැත්තේ ද, ඒ තාක් කල් පහ වූ මිද්ධය හා අලස බව ඇතිව අධිෂ්ඨාන කරන්නේ ය.

මෙම මෛත්‍රී විවරණය මේ බුද්ධ ශාසනයේ ශ්‍රේෂ්ඨ ම විවරණය වේ. මෙයින් පැහැදිලි වන්නේ සිටින, ඇවිදින, සිටගෙන හා නිදන යන ඉරියව් සතරේ දී ම මෛත්‍රී පූර්වාංගම කුසල සිතින් ක්‍රියා කිරීම යහපත පිණිස, ජීවිතයේ දියුණුව පිණිස හේතු වන බව ය.

මේ කරුණු සියල්ල නුවණින් තේරුම් ගනිමින් ලෝකයේ සියලු සත්ත්වයන් කෙරෙහි ඇතිකර ගත් කාරුණික සිතක් හා හෘදයාංගම දයාවක් සහිත ව මෛත්‍රී සහගත චේතනාවන්ගෙන් ජීවිතය ගවසා ගෙන, මෙලොවත් පරලොවත් සැපය පිණිස ක්‍රෝධය, වෛරය, ද්වේෂය, තරහව නම් වූ අකුසල චිත්ත චෛතසිකයන් දුරින් ම දුරු කිරීමට මෙලෙස ධර්මයෙන් ලැබෙන මඟ පෙන්වීම නිවැරැදිව තේරුම් ගත යුතු ය. ක්‍රෝධයේ ආදීනව මෙලොව පරලොව දුගතිය පිණිස බලපාන අයුරු සිහියෙන් දැකිය යුතු ය. සුවපත් මනසක් සහිත ජීවිතයක් ගත කළ හැක්කේ එවිට ය.


**සිතකය වදනින් මෙත් ගුණ මතුවී**
**සාමය සමඟිය ලෝ තුළ පැතිරී**
**සැම දෙන එක මවකගෙ දරු කැළ සේ**
**සොම්නස් වෙත්වා සැනසෙත්වා**

**ශාස්ත්‍රපති රාස්සගල**
**චන්දකිත්ති හිමි**

# දෙස් විදෙස් සම්භාවනාවට පාත්‍ර වූ

## මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ පහළ දෙළොස්පත්තුවේ ප්‍රධාන සංඝනායක

## ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත පූජ්‍ය පන්නල සුමේධ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ



**මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ පහළ දෙළොස්පත්තුවේ ප්‍රධාන සංඝනායක ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත පූජ්‍ය පන්නල, සුමේධ නායක හිමිපාණන් වහන්සේ ලංකා ශාසනාම්භරය ආලෝකවත් කළ ධර්ම විනයධර ශ්‍රද්ධා සම්පන්න ආදර්ශවත් සංඝ නේතෘන් වහන්සේ නමක් වශයෙන් හැඳින්විය හැකි ය.**

**යො හොති විසාරදොච –**
**බහුස්සුතො ධම්මධරො ච හොති**
**ධම්මස්ස හොති අනුධම්මචාරි –**
**සතාදිසො වුච්චති සංඝ සොභනො**

යමෙක් ව්‍යක්ත ද, විශාරද ද, බහුශ්‍රැත ද, ධර්මයට අනුකූලව හැසිරෙන්නේ වේ ද හෙතෙම සංඝ ශාසනය බබුළුවන්නෙක් වේ.මෙම බුදු වදන වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම භික්ෂුත්වය ශෝභමාන කරණ ගුණාංග රාශියකින් උන්වහන්සේගේ චරිතය සමන්විත වෙයි.

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල නමින් හඳුන්වන ස්වභාවික සෞන්දර්යයෙන් අනූන රමණීය ගම් පියසක උන්වහන්සේගේ ජන්මෝත්පත්තිය සිදුවිය. 1947 වර්ෂයේ දෙසැම්බර් මස 04 වැනි දින ජන්මලාභය ලැබූ නාහිමිපාණන් වහන්සේ නුංගමුව මහසෙන් මහා විද්‍යාලයෙන් මූලික අක්ෂර ශික්ෂාව ලබා ගත් කාල පරිච්ඡේදයේ සිටම තුනුරුවන් කෙරෙහි බොහොම ගෞරවයෙන් ශ්‍රද්ධාවෙන් කටයුතු කරන්නට වූහ.

කුඩා කල සිටම තුනුරුවන් කෙරෙහි අපරිමිත ගෞරවයෙන් කටයුතු කළ පන්නල සුමේධ ස්වාමීන්ද්‍රයන් වහන්සේ මව්පියන්ගෙන් ලැබුණු ශාසනික උරුමයත්, සංසාරේ පුරන ලද පාරමිතා බලයත් මත දඹදෙණිය වේවැල්වල සෝනුත්තරාරාම විහාරාධිපති පූජ්‍ය ගලතරේ ශ්‍රී සරණපාල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ශිෂ්‍යයකු වශයෙන් උතුම් ප්‍රව්‍රජ්‍යාභාවය ලබා ගත්හ. 1960 වර්ෂයේ ජනවාරි මස 20 වැනි දින පන්නල සුමේධ යන උත්තරීතර ශාසනික නාමයෙන් සම්මා සම්බුද්ධ ශාසනයේ සසුන්ගතව පැවිදි දිවියට ඇවැසි වත් පිළිවෙත් මූලික බණ දහම් ගුරු දේවෝත්තමපාදයාණන් වහන්සේ සෙවණේ හොඳින් ප්‍රගුණ කරමින් පිරිවෙන් අධ්‍යාපනය සඳහා පොල්ගහවෙල විද්‍යාර්ථෝදය පිරිවෙනට ඇතුළත් විය. අනතුරුව එවකට දීප්තිමත් පරිවේණාස්ථානයක් වූ කොළඹ මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙනින් උසස් අධ්‍යාපනය ලබා, රාජකීය පණ්ඩිත උපාධිය ද දිනා ගත්හ. එම පරිවේණාස්ථානයන්හි වැඩ සිටි සුපේශල ශික්ෂාකාමී ශාස්ත්‍රඥයන් වහන්සේ සෙවණේ ශාස්ත්‍රෝන්නතිකාමිත්වයෙන් යුතුව ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය කළ කාල පරිච්ඡේදයේ දී ම නිසි වයස් සම්පූර්ණ වීමත් සමඟ අධිශීල සංඛ්‍යාත උතුම් වූ සුපරිසුද්ධෝපසම්පදාවට පත්වීමට තරම් උන්වහන්සේගේ පූර්වෝපචිත පුණ්‍ය ශක්තිය බලවත් විය. එවකට අස්ගිරිමහා විහාරයේ වැඩ සිටි ශ්‍රීමත් මහානායක මා හිමිපාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් හා පූජ්‍ය ගලතරේ ශ්‍රී සරණපාල නායක හිමිපාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන් උතුම් වූ උපසම්පදා පුණ්‍යෝත්සවය අස්ගිරි මහා විහාරයේ දී සිදුවිය.

රත්මලාන පිරිවෙන් ගුරු අභ්‍යාස විද්‍යාලයෙන් ගුරු පුහුණුව ලැබූ උන්වහන්සේ 1982 වර්ෂයේ දී පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ද, 1986 වර්ෂයේ දී කැලණිය විශ්ව විද්‍යලයෙන් ශාස්ත්‍රපති උපාධියද, 1988 වර්ෂයේ දී කොළඹ ලංකා විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධිය ද දිනා ගත්හ.




අනතුරුව පන්නල සුමේධ නාහිමිපාණන් වහන්සේ කොළඹ ඇක්වයිනාස් විද්‍යාලයෙන් ඉංග්‍රීසි ඩිප්ලෝමාව ද සමත්වූහ.

සුපේශල ශික්ෂාකාමී ශාස්ත්‍රඥයන් වහන්සේ නමක් වශයෙන් තමන් වහන්සේ ලබා ගත් ධර්ම ශාස්ත්‍රිය අධ්‍යාපනය ඥාණනය කිරීමේ අභිලාෂය පෙරදැරිව 1975 වර්ෂයේ සිට පොල්ගහවෙල විද්‍යාර්ථෝදය පිරිවෙනින් ගුරු සේවය ආරම්භ කළ උන්වහන්සේ 1979 වර්ෂයේ සිට නුගේගොඩ ගංගොඩවිල සුභද්‍රාරාම පිරිවෙනේ ආචාර්යවරයකු වශයෙන් කටයුතු කරමින් සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය අභිවෘද්ධිය පිණිස ශික්ෂාකාමී සඟ පරපුරක් සම්බුද්ධ ශාසනයට දායාද කරමින් නියෝජ්‍ය

> “සම්මා සම්බුදු බුදුපියාණන් වහන්සේගේ බුද්ධ ශ්‍රාවකයකු වශයෙන් ශ්‍රී සද්ධර්මය ලොව පුරා ව්‍යාප්ත කිරීමේ භාරදූර කාර්යභාරයක නිරතවූ උන්වහන්සේ යුරෝපය, එංගලන්තය, ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය, රෝමය, ස්විට්සර්ලන්තය, තායිලන්තය, බුරුමය, ඉන්දුනීසියාව, චීනය ආදි රටවල වැඩම කරමින් උතුම් වූ පිවිතුරු බුදු දහමේ ශාන්තිය ලෝක ජනතාව වෙත දයාද කිරීමට ද ක්‍රියා කළහ.”

පරිවේණාධිපතීන් වහන්සේ නමක වශයෙන් 2004 වර්ෂයේ දී විශ්‍රාම ගත්හ. ධර්මයට ආශක්ත වූ නිසඟ දේශනා කෞශල්‍යයෙන් ධර්ම විවරණයන් මනාව හසුරවමින් අටුවා ටීකා, සන්නස, ගැටපද විවරණ සහිතව පෙළ දහමෙන් සුපෝෂිත වූ රසාලිප්ත ධර්ම දේශනා විලාසයෙන් ගුවන්විදුලි, රූපවාහිනී ධර්ම දේශනා හා ධර්ම සාකච්ඡාවන්හි නිරත වූ උන්වහන්සේ ධර්ම ග්‍රන්ථ රාශියක් ශාස්ත්‍රීය ලෝකය වෙත දායාද කරන්නට උත්සුක විය.

අනුරාධපුර යුගයේ සාහිත්‍ය නිර්මාණ, බුද්ධ සංකල්පය පිළිබඳ නිබන්ධන, බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීමේ විධික්‍රමය, විජයබා අස්න- කුවේණි අස්න ඉංග්‍රීසි පරිවර්තනය, මී වැව විත්තිපොත සරල බසට මුද්‍රණය කිරීම, සූත්‍ර පිටකයෙන් දානය 1,2 ග්‍රන්ථ, දඹදෙණි යුගය – ඉතිහාසය, භක්තිගීත හා පද්‍ය කාව්‍ය සංග්‍රහය, දඹදෙණිය – සාහිත්‍ය ග්‍රන්ථය සංස්කරණය – 1992 – දඹදෙණි දළදා පෙරහර – සඟරා සංස්කරණය හා ත්‍රිපිටක ග්‍රන්ථ පරිවර්තන මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ධම්මපදට්ඨ කථාව, සිංහල පරිවර්තනය, ආදී ග්‍රන්ථ ඒ අතර විය.

ක්‍රි.පූ. හයවැනි සියවසේ සිද්ධාර්ථ ගෞතමයාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් අනතුරුව සිය ධර්ම දේශනා කිරීම ආරම්භ කළහ. බුදුන් වහන්සේගේ ධර්මය ශ්‍රවණය කර අවබෝධ කරගත් පිරිස උන්වහන්සේගේ ශ්‍රාවක ගණයා බවට පත්වූහ. දින කිහිපයක් ඇතුළත බුදුන් වහන්සේගේ ශ්‍රාවක භික්ෂු පිරිස සැටනමක් වූ අතර, උන්වහන්සේලාට බුදුන් වහන්සේ දෙනු ලැබූ පළමු ඔවදන වූයේ

**චරිත භික්ඛවේ චාරිතකං බහුජන හිතාය බහුජන සුඛාය ලොකානුකම්පාය**

මහණෙනි, බොහෝ දෙනාට හිත සුව පිණිස, ලෝකයාට අනුකම්පා පිණිස, දෙව් මිනිසුන්ට වැඩ පිණිස හිත සුව පිණිස චාරිකාවේ හැසිරෙන්න යන බුද්ධ දේශනාවට අනුව චිරාගත සම්ප්‍රදාය අනුගමනය කරමින් සම්මා සම්බුදු බුදුපියාණන් වහන්සේගේ බුද්ධ ශ්‍රාවකයකු වශයෙන් ශ්‍රී සද්ධර්මය ලොව පුරා ව්‍යාප්ත කිරීමේ භාරදූර කාර්යභාරයක නිරත වූ උන්වහන්සේ යුරෝපය, එංගලන්තය, ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය, රෝමය, ස්විට්සර්ලන්තය, තායිලන්තය, බුරුමය, ඉන්දුනීසියාව, චීනය ආදි රටවල වැඩම කරමින් උතුම් වූ පිවිතුරු බුදු දහමේ ශාන්තිය ලෝක ජනතාව වෙත දායාද කිරීමට ද ක්‍රියා කළහ.

ස්වකීය ආචාර්යපාදෝත්තමයාණන් වහන්සේ වශයෙන් කටයුතු කළ පූජ්‍ය ගලතරේ ශ්‍රී සරණපාල ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අපවත්වීමෙන් දඹදෙණියේ වේවැල්වල ශ්‍රී සෝනුත්තරාරාම විහාර ඝණයේ විහාරාධිපතීන් වහන්සේ වශයෙන් කටයුතු කරමින් ජාතික, ආගමික, ශාසනික වශයෙන් සුවිශාල කර්ය භාරයක් සිදුකරනු ලබයි.

ප්‍රතිබල සම්පන්න, ව්‍යක්ත, විශාරද යතීන්ද්‍රයන් වහන්සේ නමක් වශයෙන් දේශීය මෙන්ම විදේශීය බෞද්ධ ජනතාව අතර ද ගෞරවාදරයට පාත්‍ර වූ පන්නල සුමේධ නාහිමිපාණන් වහන්සේගේ 75 වැනි ජන්ම දිනය දෙසැම්බර් මස 04 වැනි දිනට යෙදී තිබීම නිමිත්තෙන් පින්කම් රාශියක් සිදුකිරීමට ශිෂ්‍ය පිරිස සහ දායක සභාව විසින් කටයුතු සංවිධානය කර ඇත.

පූජනීය පන්නල සුමේධ නාහිමිපාණන් වහන්සේට ලෝ සසුන් වැඩ පිණිස නිදුක් නිරෝගි සුවය සමඟ චිරජීවනය බැතිබර පූර්වකව ප්‍රාර්ථනා කරමි.

හේමමාලා රන්දුනු

# පහන් සිතක කවි



සංස්කරණය
දීපා පෙරේරා



## දම් සිසිලෙන් ...

දම් සිසිලෙන් මගේ සිතේ මල් පිබිදෙන වා
ඒ මල්වල පෙති අමුණා ගී මුමුණන වා
ජය ශ්‍රී මහ බෝසමිඳුන් වෙත පැමිණෙන වා
බෝ සමිඳුට පූජාකර නිවන් පතන වා

අර පැත්තේ අහස දෙසින් කොත දිලිසෙනවා
ගැමුණු රජුගෙ විස්කම් ගැන පුදුම හිතෙනවා
සාධු සාධු රන්මැලි සෑ රදුන් වඳින වා
බුදු සමිඳුගෙ ධාතු නමැද නිවන් පතන වා

**කේ.එම්.ඩී.සමිරු තමුදිත**
නුංගමුව, පල්ලෙවෙල

## පෙම්ගීය

අඬමින් වැළපෙමින් දුක්වෙන සත අතරේ
අකම්පිත සිතක් වඩවා ගනු මිතුරේ
රැස්කරමින් දුවන නොපෙනෙන සංසාරේ
අවසන් තිත තබව් වීරිය ගෙන සොයුරේ

ඔළුවෙහි කෙස් අඩුය බණ ඇසුවා වැඩි ය
එනමුත් මතකයේ නැත දහමෙහි හරය
සරුකර ගැනීමට දහමෙන් සිය දිවිය
සතිමත් සිතක් වැඩුමට ගනු මැන දිරිය

ලාබ අලාබෝ අයසෝ යන දහම
හමුවේ සැළෙන සිත විඳවනවා දුකම
දුකමත පිහිටි ලෝකය හමුවේ සැවොම
පෙම් ගී ගයයි මරු කැන්දන් යන තුරුම

**බිබිලේ ධම්මසිරි හිමි**
කජුවත්ත සේනාසනය
දෙහිඅත්තකණ්ඩිය

## සඳගිරි මහ සෑ රදුන් වහන්සේ



හන්තානේ කඳු වළලු සිසාරා සීත සුළං රැළි විහිදෙනවා
අරුණාළු උදයේ මිහිදුම් සේලය ඇදී ඇදී ඈතට යනවා
ඒ අතරින් රන් හිරු රැස් වැටිලා මුළු පරිසරය ම හැඩ වෙනවා
සඳගිරි මහා සෑ රදුන් වහන්සේ මුතු අහුරක් සේ දිදුලනවා

**මාවනැල්ලේ එස්.ආර්.එම්.ජයසේකර**
අංවාරම , මාවනැල්ල

## සැනසීම

සමිඳුන් දෙසුව බණ ඇසුණා දෙසවනට
ගිහිගෙය බිය කරුයි හැඟුණා පොඩි සිතට
නිෂ්ඵල නිමක් නැති සසරේ බව දුකට
එනිසයි මඟ සොයන් ආවේ කහවතට

බෝපත් සිසිල හැමවිට මොනවද කීවා
ලොකු හිමි හිත හදා හොඳ බුදු බණ කීවා
එහෙ මෙහෙ දුවන සිත නිති සුවපත් වුවා
සැනසුම මෙයයි නිවනට නිසි මඟ කීවා

පෝදා පන්සලම එළියයි පින්පාටයි
සිල් ඇත්තන් පිරී හැම තැන සුදුපාටයි
වෙහෙරෙත් විහාරෙත් නිති දම් හඬ පැතිරෙයි
සාධුකාර හඬ එන විට සිත තුටුවෙයි

ආවත් විටෙක ගැරහුම් සහ දුක් ගැහැට
හැමවිට හිත හදන් හිටියේ පෙර පිනට
බුදු හිමි දෙසූ දහමට සිත යොමන විට
කිසිවිට දුකක් නැහැ සැනසීමයි සිතට

**ඉංගිරියේ සීලරතන හිමි**
හපුදණ්ඩාව

## මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ

බුදුරදුන්ගෙ පිරිනිවනින් තෙමසක් ගිය තැන දී
අනුබුදු කස්සප මුනිඳුගෙ අනුශාසන පරිදී
ශාක්‍ය මුනි බුදුරජුන්ගෙ ධර්මය නිසි පරිදී
රැස් කොට රක්ෂා කළාලු අනුබුදු නිසි තැන දී

වසර සියක් විස්සක් ආයුෂ වළඳා සොඳිනේ
සූ විසි දෙකකුත් අනුබුදු පදවිය දැරූ ලෙසිනේ
සසර ගමන කෙළවර කොට අනුබුදු ලෙස සොඳිනේ
නිවන් පුරට සැපත් වුණා උත්තමයකු ලෙසිනේ

**කේ. ආදිත්‍ය ප්‍රභාශ්වර ද සිල්වා**
අම්බලන්ගොඩ

## සැහැල්ලු සිත

සියලු සම්පත් අතහැර
පැවිදි වෙස් ගත් ඒ හිමියෝ
ගුරු හාමුදුරුවන්ගෙන් සමුගෙන
මහ වනයට වැඩියහ
සිත සැහැල්ලු ය ගත සැහැල්ලු ය
රකින්නට කිසිවක් නැත
සොබා දම් දිනිතිය තෙරණුවන්ට
ආශීර්වාද කළා ය
පිරිසුදු වාතය පැන් වනපල සෙවණ
දුන්නා ය
රුදුරු වනසතුන් ද හිමි දැක ආදරය කරුණාව
උපදවා ගත්හ
වන සෙනසුන වෙස්වළාගත් රැකවරණයක් විය
නිහඬව බවුන් වඩන ඒ තෙරණුවෝ
සදහම් අවබෝධ කර ගනිමින් වැඩ සිටියහ

**චන්ද්‍රා සිරිසීලි වික්‍රමාරච්චි**
නැදුන්ගමුව

## නව අරහාදී ගුණකඳ අබියස



හිමිගේ දහමින්
හද පුරවාගන
මහ මළුවේ
අපි සිල් ගත්තා

සියලු සත්වයෝ
නිදුක් වෙන්නැයි
දෙනෙත පියාගෙන
මෙත් වැඩුවා

හිත කළඹාගෙන
ආව කෙලෙස් රැලි
ඈතට පා කර
බුදු මහිමය
සිහියට නැගුවා
නව අරහාදී ගුණකඳ
අබියස හිස නැමුවා

**මාස්පොත ධම්මජෝති හිමි**
මීරිගම

## සිල් මාතාවක් වෙන්න



බුදු හිමි දෙසූ දම්පද සිහියට ගන්න
මගේ මුවග බුදු ගුණ දම් රැව් දෙන්න
භවයේ ඇති දුක අනියත බව සිතන්න
ආසයි මටත් සිල් මාතාවක් වෙන්න

**එල්. මල්ලිකා ජයසිංහ**
පාණදුර

බුදුසරණ
පහන් සිතක කවි
BCC

සම්පූර්ණ නම :– ..........................................................................
ලිපිනය :– ..........................................................................
දුරකථන අංකය :– ..........................................................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක
සතර පෝදටම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ.
ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න.
සංස්කාරිකා,පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.

# ද්වේශය සිත තුළ ඉපදී සිත ම දවාලන ගින්නකි

**ඕනෑම මනුෂ්‍යයකු තුළ රාග, ද්වේශ, මෝහ කෙලෙස් පවතී. එබැවින් තරහ යාමට ස්ත්‍රී, පුරුෂ භේදයක් නැත. ආගම් ජාති භේද නැත. ලොකු කුඩා තරුණ මහලු වයස් භේදයක් ද නැත. ඉහත කී කෙලෙස් මුල් තුන උපතින්ම උරුම වන දේ ය. මෙම කෙලෙස් මුල් සිත තුළ නිදා සිටින සතුරන් තිදෙනකු වැනි ය. කෙලෙස් ඇවිස්සුන විට පාප කර්ම සිදුවන අවස්ථා වැඩි ය. සියලු දෙනා තුළම කෙලෙස් මුල් අඩු වැඩි වශයෙන් පවතී.**

සිත පාලනය කරගත නොහැකිවීම කෙලෙස් වර්ධනයට හේතු වේ. බාහිර ලෝකයෙන් ලබා ගන්නා රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ අනුව කෙලෙස් ධර්ම ඉස්මතුවීමට පටන් ගනී. මෙම කාර්යයේ දී සිත ප්‍රධාන තැනක් ගනී. සිත කැමති නම් පංචකාම වස්තුවලට සතුටු වේ. පංචකාම වස්තූන්ට අකමැති වේ නම්, තරහව හෙවත් ද්වේශය හට නොගනී. සිත පාලනය නොවීම නිසා ද්වේශය දුර දිග යනු ඇත.

ද්වේශයට පත්වීමේ දී චරිතය ද බලපාන කරුණකි. සියලුම මිනිසුන් චරිත හයකට අයත් වේ. එනම් රාග, ද්වේෂ, මෝහ, ශ්‍රද්ධා, බුද්ධි විතර්ක වශයෙනි.

රාග චරිතය තෘෂ්ණාවෙන් යුක්ත ය. මෙම චරිතය තුළ රාගය වැඩියෙන් ද, ද්වේශය සහ මෝහය අඩුවෙන් ද පවතී. රාග චරිතයා ද්වේශ චරිතය මෙන් ඉක්මණින් කිපෙන්නේ නැත. එබැවින් තරහ යාමේ දී පළිගැනීම ප්‍රමාද වේ.

ද්වේශ චරිතය තුළ තරහව වැඩිපුර පවතී. ඉතා සුළු කරුණක දී පවා කිපෙන ගතියෙන් යුක්ත ය. ද්වේශ සහගත සුළු කරුණක් වුව ද සිතේ රඳවාගෙන ක්‍රෝධයෙන් පසුවන ගතියක් ද ද්වේශ චරිතය තුළ ඇත. පිටතට පෙන්වන ගතිගුණ අභ්‍යන්තරයේ නො පවතී. තරහ යාමේ දී ඉක්මණින් ම කෝපයට පත්වීම ද්වේශ චරිතයාගේ දුර්ගුණයකි. එසේම පළිගැනීම ද වහාම සිදු කිරීම සිරිතකි. තරහ යාමේ දී ඉවසීමේ ගුණය අඩුම පුද්ගලයා ද්වේශ චරිතය ය.

මෝහ චරිතය ඒ නමින් ම හඳුන්වා තිබෙන්නේ නුවණ අඩුකම නිසා ය. යමක් සිතා මතා තීරණය ගැනීමේ ශක්තිය නැත. නුවණ සහ දැනුම අතින් දුර්වල චරිතයකි. යම් කිසිවකු පවසන දෙයක් ඒ ආකාරයෙන් ම පිළිගැනීම මෝහ චරිතයේ ලක්ෂණයකි. මිථ්‍යා අදහස් වැඩිපුර දක්නට ලැබේ. ධර්මය වටහා ගැනීම ද අපහසු ය. දුරදිග නොබලා ඉක්මන්වීම නිසා පාඩු සිදුකර ගනී. ද්වේශයට පත්වීමේ දී සොයා නොබලා කෝපයට පත්ව විනාශකාරී දේ ද සිදු කළ හැකි ය.

ශ්‍රද්ධා, බුද්ධි, විතර්ක චරිතයන් තුළ ද රාග, ද්වේශ, මෝහ පවතී. එහෙත් සෙසු චරිතයන්ගේ මෙන් නොව යම් ප්‍රමාණයකට කෙලෙස් පාලනය කර ගත හැකි තත්ත්වයක් පවතී.

තනතුරු, තාන්න මාන්න, ලාභ සත්කාර, අහිමිවීම තුළ ද්වේශය හටගනී. බුද්ධ කාලීන සමාජය තුළ බ්‍රාහ්මණ ආගම ප්‍රධාන තැනක පැවතුණි. බමුණන්ට විශේෂ වරප්‍රසාද ලැබුණි. එසේම බ්‍රාහ්මණ වංශය ප්‍රධාන කුලය බවට පිළිගැනුණි. බුදුරජාණන් වහන්සේගේ ධර්මය තුළ සමානාත්මතාව සහ නිවන විශේෂ තැනක් ගනී. සමාජයේ වැඩි පිරිසක් බුදුදහම නිවැරැදි ධර්ම බවට පිළිගනී. මේ නිසා බමුණන්ගේ මිථ්‍යා විශ්වාස සහ ඉගැන්වීම්වලට තැනක් නො වීය.

විශේෂ වරප්‍රසාද සහ රාජ්‍ය අනුග්‍රහය ආදිය නො ලැබී යාමත්, බ්‍රාහ්මණ වංශය දෙවැනි තැනට පත්වීමත් නිසා බුදුරජාණන් වහන්සේට සහ භික්ෂූන් වහන්සේට විවිධ නින්දා අපහාස කළහ. කෝපයට පත් බමුණෝ චිංචිමානවිකාව, සුන්දරී පරිබ්‍රාජිකාව මේ සඳහා යොදා ගනී. බුදුරජාණන් වහන්සේ සහ ශ්‍රාවක පිරිසගේ මනා ඉවසීමේ ගුණය නිසා නින්දා අපහාස සියල්ලම පරාජය විය.

ගුණ ධර්ම අතින් පිරිහීම නිසා ද මිනිසා ද්වේශයට පත් වේ. මිනිසුන්ට තරහ යන්නේ සිත දියුණු නොකිරීම නිසා ය. භෞතික දියුණුව යනු ගෙවල්, දොරවල්, යාන වාහන, මිල මුදල් පරිවාර සම්පත් භුක්ති විඳිමින් සුඛෝපභෝගී ව ජීවත් වීමකි. දෙලොව යහපත සඳහා ධර්මානුකූලව මනස දියුණු කිරීම ආධ්‍යාත්මික දියුණුවට හේතු වේ. භෞතික දියුණුව තුළ ගුණධර්ම දියුණුව අල්ප විය හැකි ය. කරුණාව, මෛත්‍රිය, පරෝපකාරය, පරිත්‍යාගය, කළගුණ සැලකීම, වැඩිහිටි අයට ගරු කිරීම, මවුපිය උපස්ථානය, අවිහිංසාව, යහපත් වචන කතා කිරීම, පන්සිල් රැකීම ආදී ගුණ ධර්මවල යෙදෙන අය තුළ ද්වේශය අඩුවෙන් පවතී. ද්වේශය හට ගැනීමේ දී එය පාලනය කර ගැනීමේ ශක්තිය පවතී.

ගුණධර්ම පිරිහුණ අය තුළ ද්වේශය වැඩියෙන් පවතී. ද්වේශය අධික අය ඉතා සුළු දෙයකින් පවා කෝපයට පත්වෙති. එවැනි අය තුළ ලජ්ජාව සහ භය යන දෙකම නැත. අන්‍යයන් තරහ ගැන්වීමත්, කෝප ගැන්වීමත්, අපරාධවලට ඇද දැමීමත් සිදු කරති. සිත අසංවර නම් ද්වේශය ද වැඩි වේ. මිනිසුන් ද්වේශයට පත්වන කරුණු කියා හෝ ලියා නිම කළ නොහැකි ය. රහත් නොවූ සියලු දෙනා තුළම ද්වේශ නම් වූ කෙලෙස් මූල පවතී. ද්වේශය සිත තුළ පවතින නිසා අකැමැති ඕනෑම කරුණක දී ද්වේශය ඉස්මතු වේ. එවැනි උදාහරණ කීපයක් සඳහන් කිරීම වැදගත් වේ.

අවිශ්වාසය නිසා ද්වේෂය හටගනී. සැකය නිසා විශ්වාසය පළුදු වේ. බොරු කීම, කේලම්, කපටිකම, හොරකම, පොරොන්දු කඩකිරීම, සැක සහිත හැසිරීම ආදිය නිසා විශ්වාසය නැති වේ. සත්‍ය කරුණ සැඟවීමට බොරු කීපයක් ම පැවසීමට සිදුවේ. අවිශ්වාසය විවාහ ජීවිතයට විශාල බලපෑමක් කරයි. අඹුසැමි දෙදෙනා අතර සැකය නිසා තරහවත්, කෝපයත් ඇතිවේ. එවිට දෙදෙනා අතර ගැටුම් හටගනී.

ඊර්ෂ්‍යාව, ද්වේශය ඇති කරවන තවත් සතුරෙකි. ඊර්ෂ්‍යාව යනු යම් අයෙකුගේ සැප සම්පත් සහ දියුණුව ඉවසා සිටීමට නොහැකි තත්ත්වයකි. ඉඩ කඩම්, ගෙවල් දොරවල්, යාන වාහන, මිල මුදල්, උසස් රැකියා තිබෙන පුද්ගලයාට එසේ නැති අය ඊර්ෂ්‍යා කරමින් ද්වේශයෙන් පසුවෙති. එවැනි අය කෙනකුගේ දියුණුව වළකාලීමට විවිධ උපක්‍රම යොදති. සිත තුළ ද්වේශය දරා ගත නොහැකිව පළිගැනීම්වල යෙදෙන අය වැඩි ය. ඊර්ෂ්‍යාව නිසා හටගන්නා ද්වේශය ද භයානක ය.

මත්වතුර බීම නිසා ද ද්වේශය හට ගනී. සතුරාගෙන් පළිගැනීම සඳහා අපරාධයක් කිරීමට පෙර මත් වතුර පානය කරන අය සිටිති. මේ නිසා පරුෂ වචනයෙන් බැණ වැදීම, අවි ආයුධ පාවිච්චිය දක්නට ලැබේ. මත්වතුර බීම නිසා සිත අවුල් සහගත වීම අනිවාර්යයෙන් සිදුවේ. එවැනි අයට තමන් කළ දේවල් ද කරමින් සිටින දේ හෝ කිරීමට බලාපොරොත්තු වන දේ පිළිබඳ මතක නැත.

මත්වතුර බොන ඇතැම් පියවරු නිසා පවුල් අවුල් සහගත වේ. බේබදු පියා නිතරම දරුවන්ට, බිරිඳට බැණ වදින විට ඇතැම් දරුවෝ ද්වේශයටත්, කෝපයටත් පත්වෙති. මේ නිසා පියාට පහර දෙති.

කාම තණ්හාව ද ද්වේශයට හේතු වේ. තණ්හාව විවිධ ස්වරූපයෙන් යුක්ත ය. ඉඩකඩම් දේපළවලට පවතින තෘෂ්ණාව වස්තු තණ්හාව ය. වස්තු තණ්හාව නිසා අනුන්ගේ දේපළ අයිති කර ගැනීමට යාමේ දී ද්වේශය හටගැනීමෙන් විවිධ අපරාධ සිදුකරන බව දැනගත හැකි ය.

පරුෂ වචන කීම ද්වේශය දල්වාලන තවත් කරුණකි. කනට අමිහිරි, ද්වේශයට හේතුවන වචන පරුෂ වචන ගනයට අයත් වේ. කෙනකුට දොස් කීමට පරුෂ වචන භාවිතයට ගනී. පරුෂ වචන තෙපළන පුද්ගලයා පළමුව ද්වේශයට පත්ව සිටී. පරුෂ වචන අසන තැනැත්තා පරුෂ වචනයෙන් බැණ වදී නම් ඔහු ද ද්වේශයට පත්ව ඇත. දෙදෙනාගේ ද්වේශය අවසන් නොවේ නම්, කලකෝලාහල දක්වා වර්ධනය වේ.

කෙනකුට අපහාස කිරීමේ දී පරුෂ වචන මෙන් ම සතුන්ගේ නම් සහ අසභ්‍ය චරිතවල නම් ගම් ද යොදා ගනී. එවැනි වචන ඇසීමෙන් ද්වේශය හටගනී. ණය නොගෙවීම නිසා ද ද්වේශය හටගනී. ණය ආපසු නොගෙවීම හේතුවෙන් ණය දුන් අය සහ ණය ලබාගත් අය අතර ආරවුල් හටගනී.

ණය ලබා ගැනීම ප්‍රමාද වීම නිසා හෝ නො ලැබීයාම නිසා වැඩියෙන් ම ද්වේශයට පත්වන පුද්ගලයා ණය හිමියා ය.

විහිළු තහළු කිරීම නිසා ද ද්වේශය හටගනී. තැන නොතැන නොබලා හෝ තරාතිරම නොබලා විහිළු කිරීමෙන් ද්වේශය ඇති වේ. විහිළුවට අකමැතිවීම තුළ එය දුරදිග යාමට පුළුවන. විහිළුවෙන් ඇස් රතුවනවා ය යන කියමන ඒ නිසා ගොඩනැඟී ඇත.

සතුට සඳහා  යැයි සිතා කරන විහිළුව දුකෙන් කෙළවර කර ගත යුතු නැත. මිනිසුන් තරහ ගන්නා කරුණු අනන්ත ය. අප්‍රමාණ ය. සමාජයේ වැඩි වශයෙන් දක්නට ලැබෙන කරුණු කීපයක් පමණක් සඳහන් කර ඇත.

ශාස්ත්‍රවේදී
**කේ. සුබසිංහ**



## හෙළ කුල කත ...

03 පිටුවෙන් ...

වප් මාසයේ බෞද්ධාගමික වැදගත්කම හා සම්බන්ධ ව රචනා කෙරෙන ග්‍රන්ථයේ මේ කරුණු පිළිබඳ දීර්ඝව සාකච්ඡා කෙරෙනු ඇත.

මෙලෙස මහා බෝධි ග්‍රහණය හා සම්බන්ධ කටයුතු දඹදිව පැළලුප් නුවර සිදුවන කාල වකවානුවේ දී ලක්දිව අනුලා දේවි ඇතුළු කාන්තාවෝ සඟමිත් රහත් තෙරණියන් වහන්සේ වැඩම කර තමා පැවිදි කරවන තුරු දස සිල් සමාදන් වී උපාසිකා විහාරයේ වාසය කළහ. මෙතැන් සිට මේ ග්‍රන්ථයෙන් සාකච්ඡා කරනු ලබන්නේ ලක්දිව භික්ෂුණී පරම්පරාවක ආරම්භය සහ එහි ව්‍යාප්තිය හා සම්බන්ධ තොරතුරුයි. භික්ෂුණී පරපුර හා සම්බන්ධ ව තොරතුරු විමසීමේ දී වඩාත් ම වැදගත් වූයේ දීපවංශය යි.

ලක්දිවට බුදුදහම ගෙන ඒමෙන් පසු ව මුල් බීජය වටා ගෙතී රෝපණය වූ ඉතිහාසය සම්ප්‍රදායයන් සමූහය එක ම ග්‍රන්ථයකට යොමු කොට සම්පාදනය කිරීමට ගත් මුල් ම ප්‍රයත්නය වූයේ දීපවංසය රචනා කිරීම යි.

ඉතිහාසය පරම්පරාවෙන් දැනට ඉතිරි වී ඇති පැරැණි ම වාර්තාව වශයෙන් දීපවංසය ක්‍රි.පූ. පළමුවන සියවසේ සිට ක්‍රි.ව. හතරවන සියවස දක්වා කාල පරිච්ඡේදය අතරතුර සකස් වූ කෘතියක් ලෙස සැලකේ. එබැවින් දීපවංසය කඩින් කඩ රචනා කර ගෙන එන ලදුව පසුව ක්‍රි.ව. හතරවැනි සහ පස්වැනි ශතවර්ෂ අතර කාලය තුළ දී ග්‍රන්ථයක් වශයෙන් සකස් කරන ලද බව ජී.සී. මැන්දිස් මහතා සඳහන් කර ඇත. දඹදිව මහා ප්‍රජාපතී රහත් තෙරණියන් වහන්සේ ගේ කාලයේ සිට ලක්දිව භාතිකාභය රාජ්‍ය කාලය (ක්‍රි.පූ. 22 ක්‍රි.ව. 7) තෙක් පැවැති භික්ෂුණී ආචාර්ය පරම්පරාව පිළිබඳ විස්තරයක් දීපවංසයේ දැක්වේ. දීපවංසය සලකනු ලබන්නේ භික්ෂුණීන් විසින් රචනා කරන ලද කෘතියක් ලෙසට ය.

පැවිදිභාවය ලබා ගැනීම සඳහා දැඩි අධිෂ්ඨානයකින්, උත්සාහයකින් හා කැපවීමකින් ප්‍රජාපතී ගෝතමිය ඇතුළු කාන්තාවන් විශාලා මහනුවරට දීර්ඝ ගමනක යෙදුණා සේ ම, ලක්දිව කාන්තාවන් පැවිදි කිරීම සඳහා වැඩම කළ සංඝමිත්තා රහත් තෙරණින් වහන්සේ ඇතුළු භික්ෂුණීන් ද, උත්තර භාරතයේ සිට රාජධානි තුනක් පසුකරමින්, වින්ධ්‍යා කඳුකරය ඔස්සේ ඉතා දුෂ්කර ගමනක යෙදෙමින් මුහුදු වෙරළට පැමිණ ලක්දිවට ගොඩබැසීම සඳහා නැව් නැඟී ආකාරය දීපවංසය මෙසේ සඳහන් කරයි.

**"තීනි රජ්ජානි තික්කන්තෝ**
**විඤ්ඣාටවිං ච ඛත්තියෝ**
**අතික්කන්තෝ බ්‍රාහාරඤ්ඤං**
**අනුප්පත්තෝ මහණ්ණාවං**
**චතුරංගනී මහාසේනා භික්ඛුනි**
**සංඝ සාවිකා**
**මහා සමුද්දං පක්කන්තෝ ආදාය**
**බෝධි මුත්තමං"**

සංඝමිත්තා රහත් තෙරණිය සමඟ දිවයිනට වැඩම කළ අනිකුත් භික්ෂුණීන් පිළිබඳ එකිනෙකට තරමක් වෙනස් වූ සම්ප්‍රදායන් තුනක් දීපවංසයේ සඳහන් වේ. මේ මුඛ පරම්පරාගත කතා තුනෙන් කියවෙනුයේ සඟමිත් රහත් තෙරණිය පිරිවරාගෙන පැමිණි භික්ෂුණීන්ගේ නාමාවලීන් තුනක් පිළිබඳ ය.

මෙයින් පළමුවන සම්ප්‍රදායට අනුව රුචිනන්දා, කනකදත්තා සහ සුධම්මා යන භික්ෂුණීන් සඟමිත් තෙරණින් වහන්සේ සමඟ ලක්දිවට පැමිණි බව කියැවෙන අතර, දෙවැනි සම්ප්‍රදායේ සඳහන් වන්නේ තරුණ භික්ෂුණීන් දස දෙනකු සඟමිත් රහත් තෙරණිය පිරිවරා පැමිණි බවයි.

ඔවුහු නම් වශයෙන් උත්තරා, හේමා, මසාරගල්ලා, අග්ගිමිත්තා, දාසිකා, ඵෙග්ගු, පබ්බතා, මත්තාමල්ලා සහ ධම්මදාසියා නම් වූහ.

තුන්වැනි සම්ප්‍රදායට අනුව මහාදේවි, පදුමා, හේමාසා, උන්නලා, අඤ්ජලි සහ සුමා ආදී භික්ෂුණීන් දහසය දහසක් සමඟ සඟමිත් රහත් තෙරණින් වහන්සේ කැටුව පැමිණ ඇත."

මෙහි ඇතැම් නාමයන් පිළිබඳ පරස්පර විරෝධතාවන් ද දක්නට ලැබේ. බී.සී.ලෝ පඬිවරයා දක්වන ආකාරයට මේ සම්ප්‍රදායයන් තුනෙන් එකඟතාවයක් දැක්විය හැක්කේ "ඉන් පළමුවැන්න බෝධි ශාඛාවේ භාරයට පත් කරන ලද සඟමිත් රහත් තෙරණිය ඇතුළු භික්ෂුණීන් එකොළොස් දෙනා හා අදාළ වන බවත්, දෙවැනි සම්ප්‍රදාය සඟමිත් රහත් තෙරණිය ඇතුළු භික්ෂුණීන් එකොළොස් දෙනා හා අදාළ වන බවත් තුන්වැනි සම්ප්‍රදාය සඟමිත් රහත් තෙරණියගේ බොහෝ වූ පරිවාරිකාවන් අතර වූ නායක තෙරණින් සය දෙනා හා අදාළ වන බවත් සැලකීමෙන් පමණකි.

මෙලෙස කාන්තාවන් දහස් ගණනින් පැවිදිවීම නිසා ලක්දිව භික්ෂුණී පර්ෂදය විශාල ලෙස පැතිරෙන්නට විය. එයට සාධක වංසකතාවලින් ම ලැබේ. ඉතිහාසය පරම්පරාවෙන් දැනට ඉතිරි වී ඇති පැරැණිම වාර්තාව වූ දීපවංසයට අනුව පැරැණි ලක්දිව වැඩ සිටි භික්ෂුණීන් සංඛ්‍යාව විසි දහසකි. මහාවංසය සඳහන් කරන ආකාරයට දුටුගැමුණු රජුගේ (ක්‍රි.පූ. 161 - 137) මිරිසවැටි පූජා උත්සවයට භික්ෂූන් ලක්ෂයක් ද, භික්ෂුණීන් අනූහතර දාහක් ද පැමිණියහ. 'මහාචූල මහාතිස්ස' රජුගේ පාලන සමයේ දී (ක්‍රි.පූ. 77 -63) භික්ෂූන් හැටදහසකට ද, භික්ෂුණීන් තිස්දහසකට ද සිවුරු සපයනු ලැබ ඇත. මෙවැනි මනඃකල්පිත සංඛ්‍යාවන් කෙරෙහි එතරම් විශ්වාසයක් තැබිය නොහැකි බව විල්හෙල්ම් ගයිගර්ගේ අදහස වුව ද එම සංඛ්‍යා දත්තවලින් අපට වැදගත් නිගමනයකට එළඹිය හැකි ය.

එනම් එම මනඃකල්පිත සංඛ්‍යාවන් භික්ෂු භික්ෂුණීන් දෙපක්ෂයට ම පොදු වූ බව යි. භික්ෂු භික්ෂුණී අනුපාතය අතිශයෝක්තියක් ලෙස දැක්වීමට හේතු නැත. මිරිසවැටි පූජා උත්සවයේ දී භික්ෂු භික්ෂුණී අනුපාතය සියයට 90කි. මහාචූල මහාතිස්ස රජුගේ පිරිකර පූජාවේ දී එය සියයට 50 කි. ඒ අනුව අපට එළඹිය හැකි නිගමනය වන්නේ මෙම වකවානුව වන විට අවම වශයෙන් භික්ෂුණීන් සංඛ්‍යාව භික්ෂු සංඛ්‍යාව හා සැසඳීමේ දී සියයට 50 ක පමණ අනුපාතයක් වූ බවයි. එදා උඳුවප් පුර පොහොය දිනයේ දී සංඝමිත්තා තෙරණියන් වහන්සේ ලක්දිවට වැඩම කොට භික්ෂුණී පරපුරක් ඇති කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මෙලෙස භික්ෂුණී සංඛ්‍යාව ව්‍යාප්ත විය.

## යහපත් ආකල්ප ...

02 පිටුවෙන් ...

කෙසේ වෙතත් අප එතැනින් නො නැවතිය යුතු ය. අප ගේ උත්පත්තිය අප පිළිගන්නා අතර අප ආර්ය අෂ්ඨාංගික මාර්ගය ඔස්සේ යෑමට හැම ප්‍රයත්නයක් ම එක්තරා සංවර්ධන මට්ටමකට පැමිණ එහිදී භෞතික ලෝකය හා බැඳීමෙන් ජනිත කරන්නේ වේදනාව හා දුක බව වටහා ගැනීම ය.

අපමණ ඉපදීම් පිළිබඳ අවබෝධය සංවර්ධනය කරන විට ඉන්ද්‍රියයන් පිනවීම ගැන ඇති තෘෂ්ණාව අධික වෙයි. ඒ අවස්ථාවේ දී අපි සැබැවින් ම ස්වයං විශ්වාසය ඇතිකර ගනිමු. ඒ අවධියේ දී තව දුරටත් අපට සහායට වීමට දෙවියනට හැකි නොවේ. අප භෞතික අවශ්‍යතාවන් සපුරා ගැනීමට නොයන බැවිනි. බෞද්ධයෝ වහා වෙනස් වන ලෝක ස්වභාව යථා පරිදි අවබෝධය ලැබ ඇති නිසා භෞතික දේවලින් වෙන්වීම ප්‍රගුණ කරති. අනවශ්‍ය ලෙස ලෞකික දේවලට ඇලුම් නොකරති. එබැවින් තමන් සතු දේ අනුනට බෙදා දී ත්‍යාගශීලිත්වය පුහුණු කරති. මේ ආකාරයෙන් බෞද්ධයෝ අනුන් ගේ ශුභ සිද්ධිය අරභයා පරිත්‍යාග කෙරෙති.

බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් වශයෙන් සම්බෝධියට පැමිණීමෙන් පසු තමන් වහන්සේගේ ආත්මලාභය තකා ඒ අවබෝධ කර ගත් සද්ධර්මය තමන් වහන්සේ වෙත ම තබා නො ගෙන හතළිස් පස් අවුරුද්දකට නො අඩු කාලයක් මිනිසුනට පමණක් නොව දෙව් දේවතාවුනට ද බෙදා දුන් සේක. මෙය බුදු දහමේ උත්තරීතර නිදර්ශනයක් ලෙස දැක්විය හැකි පරාර්ථකාමිත්වය හා සජීවි ලෝක ශුභ සාධනයකි. විපතට පත් බැතිමතුනට බුදු රදුන් උපකාර කළ අවස්ථාවන් ද නිතර කියැවෙයි. එහෙත් ඒ උදව් මළවුනට පණ දීම වැනි හාස්කම් නොවේ. උන්වහන්සේ කළ උදවු ඥානාන්විත කාරුණික ක්‍රියා ය. එක්තරා අවස්ථාවක දී කිසාගෝතමී නමැති කාන්තාවක් තම මිය ගිය පුතුට යළි පණ ලබා දීමේ වස් බුදුරදුන් කරා එළඹියා ය. ඇය කොතරම් දුර්මුඛව සොවින් ඇළලී සිටියා ද යනු සැණින් දැන වදාළ බුදුරජාණන් වහන්සේ ඇයට කරුණු අවබෝධ කිරීම පසෙක තිබිය දී ඇය අමතා කිසිදු ප්‍රියයකු නොමළ ගෙයකින් අබ මිටක් රැගෙන ආ යුතු යැයි කී සේක.

සොවින් වියකුණු කාන්තාව ද ගෙයක් ගෙයක් පාසා දුවමින් අබ ඉල්ලා සිටියා ය. අබ දීමට මැලි නො වූව ද කිසිවකු නො මළ ගෙයක් නොවූයෙන් අබ නො ලැබිණි. හෙමින් හෙමින් කිසා ගෝතමියට වැටහී ගියේ මරණය ස්වභාවික සිදුවීමක් බවත්, ඉපදුණ සෑම සත්වයකුට ම මරණය හිමිවන බවත් ය. එම වැටහීමත් සමඟ ඈ බුදුන් වෙත පැමිණ බුදුරදුනට ප්‍රශංසා කරන ලද්දේ තමා හට මරණය පිළිබඳ සත්‍යය පෙන්වීම ගැන ය.

මෙහි ප්‍රධාන කාරණය නම් බුදුරදුන් වැඩි සැලකීමක් දැක්වූයේ ජීවිත ස්වභාවය පිළිබඳ ඇය ගේ අවබෝධය කෙරෙහි මිස ළදරුවාට පණදීමෙන් ඇයට තාවකාලික සැනසීමක් ලබා දීමට නොවේ.

ළදරුවා වැඩි වියපත්ව යළි මැරෙනු ඇත. කිසාගෝතමී මරණය නමැති කාරණය අවබෝධ කළා පමණක් නොව, බන්ධනයේ විපාක වශයෙන් දුක ඇතිවීම ගැන ද ඉගෙන ගත්තා ය. බන්ධනය හේතු කොට දුක ද, බැඳීම විනාශ කළ කල්හි දුක ද විනාශ වී යන බැව් වටහා ගැනීමට ඕ සමත් වූවා ය. බුදු සමයේ දී පුද්ගලයකුට බාහිර නියෝජනයක එනම් දෙව් දේවතාවකු ගේ ආධාරය සොයා යා හැකි ය. එය ලෞකික සුවයක් පතා විය හැකි ය. එහෙත් අවසාන සංවර්ධන අවධියේ දී ලෞකික කාරණා සඳහා බැඳීම ඒ අවස්ථාවේ විමුක්තියට හා සම්බෝධියට යොමු වන බැවින් හුදෙකලාව ම එයට මුහුණ දිය යුතු ය.

කිසියම් මිනිසෙක් විමුක්තිය සොයයි ද? අප්‍රමාණ ජාති, මරණ චක්‍රයෙන් වෙන් වි යයි ද සත්‍යාවබෝධය හා බුද්ධත්වය ලබා ද, එය සාදාගත හැක්කේ ද ඉමහත් ප්‍රයත්නයකිනි. එකාග්‍රතාවයට පත් අධිෂ්ඨානයෙනි. බුදුසමය මිනිසාට මහත් අභිමානයක් ගෙන දෙයි.

මිනිසාට තමා නිදහස් කර ගැනීමටත්, බලයක් ඇතැයි පවසන එකම ආගම බුද්ධාගමයි. තමාගේ සංවර්ධනය පිළිබඳ අවසන් අවධිවලදී වන්දනා මාන බලි බිලිවලින් තුටු කළ හැකි බාහිර බලවේග නියෝජන ආදියේ කිසිදු දයාවක් අපේක්ෂා නො කරන්නේ ය.

## සැනසුම් පිළිවෙත

සිතන සිතිවිලි ලියන ලියවිලි
කියන මැසිවිලි අනන්තයි
සසර සරනා කෙනාහට මෙය
ඉතා බියකරු පිළිවෙතයි
යොමා යුග නෙත බලා දස අත
නොගෙන සිතිවිලි අහිතවත් ලෙස
විගස දහමට නැඹුරු වනුනට
විරිය වැඩුමට සම්පතයි
එයම නිවනට මඟ සදයි
එයම ජීවන මංපෙතේ
සදා සැනසුම් පිළිවෙතයි

කල්ප සුවහස් කල්ප ගණනේ
පෙරුම් දම් පිරූ සම්දුගේ
නිමල දහමේ වෙළී පැටලී
නියුතු වීමෙන් ලැබෙයි සැනසුම
සදා සැනසුම ලබා ගන්නට
අනගි මාවත එය තමයි

දිනපතා සිත පෙරටු ගන්වා
අරි අටැඟි මග සිත තබා
දිවා රැයෙහිම සියලු ලෝ සත
වෙතට සැනසුම සලසලා
යොමා සිතිවිලි සිතා යහපත
වඩමු වීරිය නිතිපතා

ජරා මරණය පිටු දකින්නට
සෙත් පතන මඟ පිළිවෙතයි
බිඳි බිඳී යන මේ කයේ
ජරා මරණය පිටු දකින්නට
දහම ඔසුවකි මුනිඳුගේ
නිවී සැනසෙන නිවන අප හැම
පතමු නිති වී සැනසුමේ

දහම අටලෝ වෙතින් කම්පා
නොවී සැනසුම ළඟා කරගෙන
සදා යහපත්
සියලු සිතිවිලි
ලියන ලියවිලි
කියන කියවිලි
බුදු මගෙහි නියැළෙමින් ලැබ ගමු

උපේක්ඛාවෙන් නිවී නිතරම
බ්‍රහ්ම විහරණ වඩාලා
සදා සැනසුම ලබා ගන්නට
නිවන පෙරටුව දහමේ නියැළී
සැමට සුවසෙත ලබා දී
අපිත් ළං වෙමු
නිවන් දොර වෙත
සදා ඉපදෙන
මියෙන ලෝකෙන් නික්මිලා

අමා මෑණී මුනිඳු වදහළ
සතර සතිපට්ඨාන පිළිවෙත
නිතර වැඩුමට අවසරයි
නිවි නිවී සැනසුම ලබන්නට
එයම පෙරමුණු වන වගයි
නිදන නොනිදන යනෙන හැමවිට
වැඩිය යුතු දම් පිරිවෙනයි
සදා සැනසුම
සිතේ එකඟය
එයම අප හට සම්පතයි

**සුමිත්‍රා පරුස්සැල්ල**
ඊරියගොල්ල, දෙහිඕවිට